# රණවිරුවා

2021 පෙබරවාරි • 226 කලාපය



## ඓතිහාසික දිනයේ අභිමානවත් සැමරුම

# 73 වන ජාතික නිදහස් දිනය...

මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ.



# 73 වන ජාතික නිදහස් දිනය අභිමානවත්ව සමරයි...



"ඉසුරුමත් හෙට දිනක් - සෞභාග්‍යමත් මව්බිමක්" යන තේමාව පෙරදැරිව ශ්‍රී ලංකාවේ ස්වෛරීභාවය, භෞමික අඛණ්ඩතාව, ආර්ථික සංවර්ධනය, සංහිඳියාව සහ සාමකාමී සහජීවනය ශක්තිමත් කිරීම සඳහා වූ කැපවීම යළිත් තහවුරු කරමින් 73 වන ජාතික නිදහස් දින සැමරුම් උත්සවය ඉකුත් පෙබරවාරි 04 වන දින කොළඹ 7 පිහිටි ඓතිහාසික නිදහස් චතුරශ්‍රය අභිමුවදී මහත් අභිමානවත් අයුරින් හා උත්සවශ්‍රීයෙන් පැවැත්විණි.

සන්නද්ධ හමුදා සේනාධිනායක හා අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන් ගේ ප්‍රධානත්වයෙන් පැවති මෙවර නිදහස් සැමරුමට ජනාධිපති ආර්යා අයෝමා රාජපක්ෂ මැතිණිය, ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමන් සහ ශිරන්ති රාජපක්ෂ මැතිණිය, හිටපු ජනාධිපති, කථානායක, අගවිනිසුරු, විපක්ෂ නායක ඇතුළු ප්‍රභූන් රැසක්, ආරක්ෂක ලේකම්, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී සහ යුද්ධ හමුදාධිපති, ගුවන්, නාවික සහ පොලිස්පති ඇතුළු ජ්‍යේෂ්ඨ ආරක්ෂක අංශ සාමාජිකයින් රැසක් සහභාගි වූහ. නිදහස් චතුරශ්‍ර පරිශ්‍රය පුරා නිදහසේ කාහල නාදය පැතිරූ එම අභිමානවත් මොහොතේ විශේෂ මතක සටහන් මෙහි දැක්වේ.














# වෙඩික්කරුවන්ට සම්මාන පිරිනැමේ...

යුද්ධ හමුදා අන්තර් රෙජිමේන්තු ප්‍රායෝගික රයිෆල් වෙඩි තැබීමේ තරගාවලියේදී 2021 වසරේ ජයගත් ක්‍රීඩකයින් හට සම්මාන පිරිනැමීමේ උත්සවයක් දියතලාව ප්‍රගුණ හා සැඟවුණු වෙඩික්කරු පුහුණු පාසලේදී ඉකුත් පෙබරවාරි 25 වන දින පැවැත්විණ. මෙම අවස්ථාවට එම පුහුණු පාසලේ සේනාවිධායක හා ශ්‍රී ලංකා සුළු අවි සංගමයේ සභාපති බ්‍රිගේඩියර් ඩබ්ලිව්ටීඩබ්ලිව්ජී ඉහලගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ගේ ආරාධනයකට අනුව ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී මෙන්ම යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී සහභාගි විය.

තරගාවලියේ විවෘත කාණ්ඩය යටතේ දක්ෂතම කණ්ඩායම සඳහා වූ සම්මානය ගැමුණු හේවා රෙජිමේන්තුව විසින් දිනාගත් අතර එහි දෙවන හා තෙවන ස්ථාන පිළිවෙලින් ගජබා රෙජිමේන්තුව සහ විශේෂ බලකාය හිමිකරගන්නා ලදී. ආධුනික කාණ්ඩය යටතේ දක්ෂතම කණ්ඩායම සඳහා වූ සම්මානය කමාන්ඩෝ රෙජිමේන්තුව විසින් ද, එහි දෙවන ස්ථානය ගැමුණු හේවා බලකායද, තෙවන ස්ථානය විශේෂ බලකායද දිනාගත්හ. සේවා කාණ්ඩය යටතේ ශූරතාවය ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකායට හිමිවෙද්දී ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකාය එහි දෙවන ස්ථානයටත්, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා බලකාය තෙවන ස්ථානයටත් හිමිකම් කියූහ.









# විශ්‍රාමික නිලධාරීන්ට නව නිල ඇඳුමක්...



ශ්‍රී ලංකා ත්‍රිවිධ හමුදාවේ විශ්‍රාමික විරෝදාර රණවිරුවන්ගේ වෘත්තීමය ප්‍රතිරූපය, පෙනුම සහ ගෞරවය තවතවත් නිරූපණය කරමින් සුවිශේෂී ලෙස නිර්මාණය කරන ලද නව නිල ඇඳුමක් ත්‍රිවිධ හමුදාවේ විශ්‍රාමික සියලුම විරෝදාර රණවිරුවන් වෙනුවෙන් හඳුන්වාදී ඇත.



ඒ අනුව, විශ්‍රාමික ත්‍රිවිධ හමුදා රණවිරුවන්ට ජාතික උත්සව, සේවා උත්සව හෝ හමුදාමය නොවන උත්සව සඳහා පැළඳීමට නව නිල ඇඳුම් කට්ටලය හඳුන්වාදීමේ උත්සවය ඉකුත් පෙබරවාරි 02 වන දින පැවති අතර, එහි ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් ආරක්ෂක ලේකම් සහ ජාතික ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් ජෙනරාල් (විශ්‍රාමික) කමල් ගුණරත්න සහභාගී විය.



විශ්‍රාමික ත්‍රිවිධ හමුදාධිපතිවරුන්, ත්‍රිවිධ හමුදාවේ විශ්‍රාමික ජ්‍යේෂ්ඨ නිලධාරීන්, අවුරුදු 10 ත් 12 ත් අතර සේවා කාලයක් සම්පූර්ණ කර වෛද්‍ය හේතූන්මත යුද්ධ හමුදා දිවියෙන් විශ්‍රාම ලැබූ විරෝදාර රණවිරුවන්, විදේශ මෙහෙයුම්වල නිරත ශ්‍රී ලාංකික ත්‍රිවිධ හමුදා සාමාජිකයින් සහ විශේෂ අවශ්‍යතා මත නැවත සක්‍රීය සේවයට කැඳවූ රණවිරුවන් ඇතුළු ශ්‍රී ලංකා ත්‍රිවිධ හමුදා විශ්‍රාමිකයින්ගේ සංගමයේ ලියාපදිංචිව සිටින සියලුම රණවිරුවන්ට මෙම නව නිල ඇඳුම් කට්ටලය පැළඳීමේ වරප්‍රසාදය හිමි වේ. ඒ සඳහා නිල ඇඳුම් රෙගුලාසි සකස් කර මේ වනවිට ප්‍රකාශයට පත්කර ඇත.

එමෙන්ම, යුදබිමේදී දිවිපිදූ විරෝදාර රණවිරුවන්ගේ බිරින්දෑවරුන්ට හෝ ළඟම ඥාතීන්ට නීති රෙගුලාසි වලට අනුකූලව ජාතික ඇඳුම, සාරි හෝ කමිසය / කලිසම් / බ්ලේසර් සමඟ දිවිපිදූ රණවිරුවන්ගේ පදක්කම් පැළඳීමට හැකියාව ලබාදී ඇත. මෙම අවස්ථාවට ආරක්ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම්, ත්‍රිවිධ හමුදාධිපතිවරු ඇතුළු ජ්‍යේෂ්ඨ නිලධාරීන් රැසක් සහභාගී වූහ.





# අභියෝගාත්මක භූමිකාව ගෞරව බහුමානයෙන් පිදුම් ලබයි...

ශ්‍රී ලංකාවේ වඩාත්ම ප්‍රශංසනීය සමාගම් - 2020" වෙත සම්මාන ප්‍රදානය කිරීමේ උත්සවයක් ඉකුත් පෙබරවාරි 10 වන දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේදී පැවැත්විණි. ශ්‍රී ලංකාවේ සමාගම් අතර වඩාත් කැපීපෙනෙන සමාගම් තම කොටස් හිමියන්, ගණුදෙනුකරුවන්, සේවකයින් සහ පොදුවේ ප්‍රජාව සඳහා කරනු ලබන සුවිශේෂ පිළිගැනීම වෙනුවෙන් පිරිනමනු ලබන මෙම සම්මාන ප්‍රදානෝත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී මෙන්ම යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී සහභාගි විය.



එහිදී "කොවිඩ්-19 වෛරසය ව්‍යාප්ත වීමේ අභියෝගය මධ්‍යයේ ව්‍යාපාර පවත්වා ගෙන යාම" යන තේමාව යටතේ යුද්ධ හමුදාධිපති විසින් දේශනයක්ද සිදුකළ අතර, අනතුරුව සම්මාන උළෙලේ වඩාත්ම ඉහළ පිළිගැනීමක් දිනාගත් සමාගම් 10 වෙත සම්මාන ප්‍රදානය කිරීමද යුද්ධ හමුදාධිපතිගේ සුරතින් සිදුකෙරිණ.

ශ්‍රී ලංකාව තුළ කොවිඩ්-19 වසංගතය පාලනය කිරීමේ කාර්ය සාධක බලකායේ ප්‍රධානියා ලෙස සිදුකරනු ලබන අභියෝගාත්මක භූමිකාව මෙන්ම ආදර්ශමත් නායකත්ව ගුණාංගයන් ගෞරවයට පාත්‍ර කරමින් යුද්ධ හමුදාධිපතිතුමන් වෙත එහිදී විශේෂ සම්මානයක්ද පිරිනැමිණ.



# පින්බිමක සිල් සුවඳ...



කොවිඩ්-19 වසංගත තත්වය මෙරටින් තුරන් කිරීම සඳහා උදාරතර මෙහෙයක් සිදුකරනු ලබන අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ රාජකාරි ඉටු කරනු කාර්ය මණ්ඩලයටත්, ත්‍රිවිධ හමුදා හා පොලිස් සාමාජිකයන් ඇතුළු සියළු පුද්ගලයින්ටත් ආශිර්වාද පතා සංවිධානය කෙරුණු විශේෂ කප්රුක් පූජාවක් ඉකුත් පෙබරවාරි 13 වන දින ඓතිහාසික සෝමාවතිය පුද බිමේදී පැවැත්විණ. එම අවස්ථාවට ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී මෙන්ම යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී සහභාගි විය.














# දීඝවාපිය ස්ථූපය ප්‍රතිසංස්කරණයට අරමුදල් ආරම්භ කරමින්...

නැගෙනහිර ප්‍රදේශයේ පිහිටා ඇති ඓතිහාසික 'දීඝවාපිය' මහා සෑය ප්‍රතිසංස්කරණය කිරීමේ අරමුදල පිහිටුවීමේ සමාරම්භක අවස්ථාව ඉකුත් පෙබරවාරි 12 වන දින උදෑසන කොළඹ ශ්‍රී සම්බෝධි විහාරයේ දී ආරම්භ විය. "දීඝවාපිය" ස්ථූපය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වූ ජනාධිපති කාර්ය සාධක බලකායේ සභාපති ජෙනරාල් (විශ්‍රාමික) කමල් ගුණරත්න මහතාගේ ආරාධනයෙන් අතිගරු ජනාධිපතිතුමා සහ ගරු අග්‍රාමාත්‍යතුමා, මෙන්ම මෙම ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය සම්බන්ධව කටයුතු කරනු ලබන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී මෙන්ම යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ඇතුළු ත්‍රිවිධ හමුදා නිලධාරීන් සහ තාක්ෂණික විශේෂඥ නියෝජිත කණ්ඩායමක් ඊට සහභාගී වූහ.

වසර ගණනාවක් මුලුල්ලේ ප්‍රතිසංස්කරණයකින් තොරව පැවතුන ශ්‍රී ලංකාවේ ඓතිහාසික සොලොස්මස්ථානයන්ගෙන් එක් ස්ථානයක් වන "දීඝවාපිය" ස්ථූපය පිළිබඳ සකසන ලද වීඩියෝ පටයක් ද එහිදී ප්‍රදර්ශණය කෙරුණු අතර, මෙම අරමුදල් රැස්කිරීමේ වැඩසටහන ආරම්භ කිරීම සනිටුහන් කරමින් "බෞද්ධයා" රූපවාහිනී නාලිකාවේ සභාපති පූජ්‍ය බොරලන්දේ වජරඥාන හිමියන් සහ ලංකා බැංකුවේ සභාපති කාංචන රත්වත්තේ මහතා සහ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි සහ යුද්ධ හමුදාධිපතිතුමා විසින් ඒ සඳහා පළමු මුදල් චෙක්පත් කිහිපය අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිඳුන් වෙත පිළිගැන්වූහ.

# 2020 උපාධි ප්‍රදානෝත්සවය ජනපතිගේ ප්‍රධානත්වයෙන්...







ආරක්ෂක අධ්‍යයනය පිළිබඳ උසස් අධ්‍යයන ආයතනයක් වන ජෙනරාල් සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ 31 වන උපාධි ප්‍රදානෝත්සවය පසුගිය පෙබරවාරි 16 වන දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්විණි.

එම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සන්නද්ධ හමුදා සේනාධිනායක අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන් සහභාගි විය. තවද ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් සහ අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමණාකරන රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් ජෙනරාල් (විශ්‍රාමික) කමල් ගුණරත්න සහ ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී මෙන්ම යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී, නාවික හා ගුවන් හමුදාධිපතිවරු ඇතුළු සම්භාවනීය ආරාධිතයින් රැසක් ද එම අවස්ථාවට එක්වූහ.

කොවිඩ්-19 සෞඛ්‍ය මාර්ගෝපදේශයන්ට අනුකූලව අදියර හයක් යටතේ පවත්වන ලද මෙම උපාධි ප්‍රදානෝත්සවයේදී උපාධිධාරීන් 1379 දෙනෙකුට ශාස්ත්‍රපති හා සම්මාන උපාධි සහතික ලබාදුන් අතර 5 දෙනෙකුට දර්ශනය සඳහා වූ ආචාර්ය උපාධිය පිරිනැමිණ. එසේම පශ්චාත් උපාධි ඩිප්ලෝමාධාරීන් 263 ක් සහ තවත් 1211 දෙනෙකු සිය ප්‍රථම උපාධිය වෙනුවෙන් ද උපාධි සහතික ලබාගනු ලැබූහ.

මෙම වසරේ උපාධි ප්‍රදානෝත්සවයේදී හොඳම හමුදා නිලධාරී සම්මානය 2 වන ලුතිනන් ආර්එම්ඩීපී රත්නායක විසින් දිනා ගන්නා ලද අතර, හොඳම නාවික හමුදා නිලධාරියා සහ ගුවන් හමුදා නිලධාරියා ලෙස පිළිවෙලින් ලුතිනන් වී එස් පලිහවඩන සහ පියාසර නිලධාරී ආර්ජීඑස්ඩී ගමගේ තේරීපත් වූහ.






# "Aero-India" වෙරළ ආරක්ෂක සම්මේලනයට යුද්ධ හමුදාධිපති එක්වේ...





2021 පෙබරවාරි මස 3 සිට 5 දින දක්වා බැංගලෝර්හිදී ඉන්දියානු සාගර කලාපයේ ආරක්ෂක අමාත්‍යවරුන්ගේ කතිකාවත, ගුවන් සමුළුව සහ ඉන්දියානු සාගර කලාපයේ නාවික සම්මන්ත්‍රණය පැවැත්විණ. ඊට සමගාමීව ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය විසින් ශ්‍රී ලංකාවේ සංවිධානය කරන ලද ඉන්දියානු සාගර කලාපයේ වෙරළාරක්ෂක සම්මන්ත්‍රණය පසුගිය පෙබරවාරි 05 වන දින කොළඹ ටාජ් සමුද්‍රා හෝටලයේදී පැවැත්විණි.

13 වන "Aero-India" සම්මන්ත්‍රණයේ කොටසක් ලෙස ඉන්දියන් සාගර කලාපීය වෙරළාරක්ෂක සම්මන්ත්‍රණය ශ්‍රී ලංකාවේ ආරම්භ කිරීමෙන් ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවන්ට අති නවීන ආරක්ෂක උපකරණ ලෝකයාට පළමු වරට ප්‍රදර්ශණය කිරීම සඳහා අවස්ථාවක් උදාවේ. සම්මන්ත්‍රණයේ සමාරම්භක උළෙලේ ප්‍රධාන ආරාධිතයින් ලෙස ශ්‍රී ලංකාවේ ඉන්දීය මහා කොමසාරිස් ගෝපාල් බග්ලේ (Gopal Baglay) ගේ ආරාධනය මත ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී මෙන්ම යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී සහභාගී විය.



# බිය නොහඳුනන ඩීඩිතර් පුතුනට යුද්ධ හමුදාධිපතිගෙන් පැසසුම්...











මඩොල්සිම පුංචි ලෝකාන්තය නැරඹීමට ගොස් අතුරුදහන් වූ 35 හැවිරිදි ත්‍රිමාණ සජීවීකරණ ශිල්පියා සොයා අභියෝගාත්මක මෙහෙයුමක නියැලුණු ශ්‍රී ලංකා යුද්ධ හමුදා විශේෂ බලකා සෙබලුන්ගේ වික්‍රමාන්විතභාවය කැපවීම, නොපසුබට උත්සාහය හා පැවරුණු කාර්යක් නොපිරිහෙලා ඉටු කිරීමේ ගුණාංගය පසුගියදා ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී මෙන්ම යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ ඇගයුමට ලක්විය. එහිදී ඉකුත් පෙබරවාරි 15 වන දින එම මෙහෙයුමට සහභාගී වූ සෙබළුන් යුද්ධ හමුදා මූලස්ථානයට කැඳවා ඔවුනට සංකේතාත්මකව ඇගයීම් සහතික හා සම්මාන පිරිනැමීමටද කටයුතු කරන ලදී.

# විරු මෙහෙය ඇගයුමට යුද්ධ හමුදාධිපති එක්වෙයි...



ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී මෙන්ම යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී රට වෙනුවෙන් දිවිපිදූ ගජබා රෙජිමේන්තුවේ විරෝදාර රණවිරුවකු සිහිපත් කරමින් ඉකුත් පෙබරවාරි 17 වන දින කළුතර, පලාතොට, තේක්කවත්ත පිහිටි ආනන්ද බෞද්ධ ආශ්‍රමයේ පැවති පුණ්‍ය කටයුත්තකට සහභාගි වූයේය.



මීට අවුරුදු 30 කට පෙර, එනම් වර්ෂ 1991 පෙබරවාරි මස 17 වන දින රුදුරු ත්‍රස්තවාදී ප්‍රහාරයකින් මන්නාරම කොන්ඩච්චි, සිලාවතුර ප්‍රදේශයේදී දැයෙන් සමුගත් ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨයේ 31 වන කෙඩෙට් නිලධාරී පාඨමාලාවේ ලුතිනන් ප්‍රසන්න ආරියරත්න වෙනුවෙන් මෙම පිංකම සංවිධානය කොට තිබිණ.





# "සුධීර කුටිය" භාවනා ගොඩනැගිල්ල යුද්ධ හමුදාධිපති සුරතින් විවෘත වේ...





යුද්ධ හමුදා භටපිරිස් විසින් නවතමයෙන් ඉදිකරන ලද හැලුම්මහර - දෙකටන, බවුන්සෙත් මානසික සෙවන විපස්සනා භාවනා මධ්‍යස්ථානයේ "සුධීර කුටිය" භාවනා ගොඩනැගිල්ල සුභ මොහොතින් විවෘත කිරීමේ උත්සවය ඉකුත් පෙබරවාරි 21 වන දින පැවැත්විණි. එම අවස්ථාවට බවුන්සෙත් භාවනා මධ්‍යස්ථානාධිකාරී ශාස්ත්‍රපති අතිපූජ්‍ය දියසෙන්පුර විමල නායක හිමිපාණන් වහන්සේ ගේ ආරාධනයෙන් ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී මෙන්ම යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී, හිටපු යුද්ධ හමුදාධිපති සහ වරාය අධිකාරියේ සභාපති ජෙනරාල් (විශ්‍රාමික) දයා රත්නායක සහ තවත් ආරාධිතයින් පිරිසක් සහභාගී වූහ.

15 වන ඉංජිනේරු සේවා බලකායේ භටපිරිස්හි ශ්‍රමදායකත්වයෙන් සහ දානපතියන් රැසකගේ මූල්‍ය අනුග්‍රහයෙන් ඉදිකරනු ලැබූ මෙම භාවනා මධ්‍යස්ථානයේ දිනපතා පවත්වනු ලබන භාවනා වැඩසටහන් සඳහා විශාල පිරිසකට සහභාගී වීමට ඉඩ පහසුකම් ඇත. මෙමගින් මේ වනවිට ත්‍රිවිධ හමුදා සහ පොලිස් සාමාජිකයින් සඳහා භාවනා වැඩසටහන් 30,000 කට ආසන්න ප්‍රමාණයක් මනෝවිද්‍යා මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ සම්බන්ධීකරණයෙන් පවත්වා ඇත.



# "Diners' Club" සැසියට එක්වෙයි...

ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකාවේ ආරක්ෂක අධ්‍යනය පිළිබඳ ප්‍රමුඛතම ආයතනය වන ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනය නුදුරේදී පැවැත්වීමට නියමිත එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ ගැටළු පිළිබඳ සාකච්ඡා කිරීම "Diners' Club" සැසිවාරය ඉකුත් පෙබරවාරි 08 වන දින කොළඹ, රන්ගල ශ්‍රී ලංකා නාවික හමුදා කඳවුරේදී පැවැත්විණි. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිතයින් ලෙස ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් සහ අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමණාකරන රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් ජෙනරාල් (විශ්‍රාමික) කමල් ගුණරත්න, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී මෙන්ම යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී මෙන්ම නාවික හා ගුවන් හමුදාධිපතිවරු ද සහභාගී වූහ. එමෙන්ම, ජාතික ආරක්ෂාව පිළිබඳ විශේෂඥයින් රැසක් ද මෙම සැසිවාරයට එක්වූහ.





# යුද්ධ හමුදාවට නව පරිත්‍යාගයක්....




ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ කාර්යභාරය අගයමින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ඉන්ධන බෙදාහැරීමේ ඒකක 10 ක් (ද්විත්ව පොම්ප ඉන්ධන ඒකක 05 ක් සහ තනි පොම්ප ඉන්ධන ඒකක 5 ක්) ඉකුත් පෙබරවාරි 05 වන දින යුද්ධ හමුදාව වෙත පරිත්‍යාග කරන ලදී. දිවයින පුරා ඇති යුද්ධ හමුදා ඉන්ධන පිරවුම්හල් තුළ දැනට පවතින පැරණි ඉන්ධන බෙදාහැරීමේ ඒකක වෙනුවට මෙලෙස පරිත්‍යාග කරන ලද නව ඉන්ධන බෙදාහැරීමේ ඒකක ස්ථාපිත කිරීමට නියමිතය.

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සභාපති සුමිත් විජේසිංහ, කළමණාකාර අධ්‍යක්ෂ බුද්ධික මැදිහේවා, නියෝජ්‍ය කළමණාකාර (අලෙවි) ක්‍රිෂාන්ත වික්‍රමසිංහ සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අලෙවිකරණ කළමණාකරු ලක්ෂාන් අබේගුණවර්ධන යන මහත්වරු බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේ පිහිටි ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලය වෙත පැමිණ සංකේතාත්මකව එක් ඉන්ධන පොම්පයක් ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී මෙන්ම යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී වෙත පරිත්‍යාග කරන ලදී.





# කොවිඩ් 19 එන්නත පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ටත්...

කොවිඩ්-19 එන්නත පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ලබාදීම කොළඹ, නාරාහේන්පිට පිහිටි යුද්ධ හමුදා රෝහලේදී ඉකුත් පෙබරවාරි 17 වන දින උදෑසන සිදුකෙරිණ. එම අවස්ථාවට ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් ගෝපාල් බග්ලේ මහතා (*Gopal Baglay*) සහ ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී මෙන්ම යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී සහභාගි වූහ. යුද්ධ හමුදා වෛද්‍ය කණ්ඩායම විසින් ප්‍රථමයෙන්ම එන්නත, ගරු කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා වෙත ලබාදෙන ලද අතර, පසුව සෙසු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට එන්නත් කිරීම සිදුකෙරිණි.



# අභිමත් ගමනකට උණුසුම් සුභ පැතුම්...

73 වන නිදහස් දිනයට සමගාමීව මේජර් ජෙනරාල් නිලයට උසස්වීම් ලැබූ යුද්ධ හමුදාවේ බ්‍රිගේඩියර් නිලයේ ජ්‍යේෂ්ඨ නිලධාරීන් වෙත නිල ලාංඡන පැළඳවීම ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී මෙන්ම යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ සුරතින් ඉකුත් පෙබරවාරි 05 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී සිදුකෙරිණි. එහිදී, මේජර් ජෙනරාල් නිලයට උසස්වීම් ලැබූ ජ්‍යෙෂ්ඨ නිලධාරී 12 දෙනෙකුට නිල ලාංඡන පැළඳවිය.

ඒ අනුව උසස්වීම් ලැබූයේ මේජර් ජෙනරාල් එම්අයිපී නානායක්කාරවසම්, මේජර් ජෙනරාල් ආර්ඒඩීපී රණවක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී, මේජර් ජෙනරාල් කේඒඑන්එන් කොස්වත්ත ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ, මේජර් ජෙනරාල් ඒඒඩීඑන්එස්පී දුනුවිල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී, මේජර් ජෙනරාල් ඩීඑම්කේඩීබී පුස්සැල්ල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී, මේජර් ජෙනරාල් එම්ඩබ්ලිව්ජේඒ විජේසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී, මේජර් ජෙනරාල් ජීඑම්සීකේබී ඒකනායක ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී, මේජර් ජෙනරාල් ඒකේජීකේයූ ඥාණරත්න එන්ඩීසී පීඑස්සී, මේජර් ජෙනරාල් ඩබ්ලිව්බීඑස්එම් අබේසේකර ආර්එස්පී යූඑස්පී, මේජර් ජෙනරාල් කේටීඒඩීඑස් කොළඹතන්ත්‍රී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී අයිජී, මේජර් ජෙනරාල් ඒසී ලමාහේවා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සහ මේජර් ජෙනරාල් ජීආර්ආර්පී ජයවර්ධන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ යන නිලධාරීහුය.

# සුහද හමුවක මතක සටහන්...




රුසියානු හමුදාව සහ ශ්‍රී ලංකා හමුදාව අතර වසර ගණනාවක් තිස්සේ පවතින ද්විපාර්ශ්වික අවබෝධතා තවදුරටත් ශක්තිමත් කරමින් ශ්‍රී ලංකාවේ රුසියානු සමූහාණ්ඩු තානාපති කාර්යාලයේ යුද, ගුවන් සහ නාවික උපදේශක කර්නල් ඩෙනිස් අයි. ෂකෝඩා (Colonel Denis I. Shkoda) ඇතුළු රුසියානු ප්‍රධානීන් කිහිපදෙනෙකු ඉකුත් පෙබරවාරි 08 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී මෙන්ම යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී හමුවූහ.

එහිදී රුසියානු සමූහාණ්ඩු සන්නද්ධ හමුදාව විසින් දැනටමත් ලබා දී ඇති පුහුණු වැඩසටහන් පිළිබඳව සිය කෘතඥතාව පුදකළ යුද්ධ හමුදාධිපති තුමන් ශ්‍රී ලාංකික ත්‍රිවිධ හමුදා සාමාජිකයින් සඳහා පුහුණු වැඩසටහන් නව ක්‍රමවේදයක් ඔස්සේ තවදුරටත් වැඩිදියුණු කිරීමේ හැකියාව සහ දෙරට හමුදාවන් අතර පවත්නා හවකාර්ය සම්පාදනය හා විවිධ හුවමාරු වැඩසටහන් පිළිබඳවද සුහදව අදහස් හුවමාරු කරගත්හ.





# රාජ්‍ය තාන්ත්‍රික උත්සවයට එක්වෙමින්...

දෙදින නිල සංචාරයක් සඳහා මෙරටට පැමිණි පාකිස්තාන ගරු අග්‍රාමාත්‍ය ඉම්රාන් ඛාන් වෙත ගෞරව දැක්වීම සඳහා වූ භෝජන සංග්‍රහයක් ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් පෙබරවාරි 23 වන දින අරලියගහ මන්දිරයේදී පැවැත්විණි. මෙම අවස්ථාවට පාකිස්තාන අග්‍රාමාත්‍යතුමන් සමග පැමිණි සාමාජිකයින්, අනෙකුත් ආරාධිතයින් මෙන්ම ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී සහ යුද්ධ හමුදාධිපති, නාවික හා ගුවන් හමුදාධිපතිවරු, පොලිස්පති ඇතුළු නිලධාරීන් පිරිසක්ද එක්වූහ.



# සනීපාරක්ෂක උපකරණ තොගයක් පරිත්‍යාග කෙරේ....

එක්සත් රාජධානියේ පිහිටි ජාත්‍යන්තර සහන හා සංවර්ධන ආයතනයේ (Muslim Aid Sri Lanka) සංවිධානයේ ආධාරකරුවන් පිරිසක් විසින් යුද්ධ හමුදාව වෙත රුපියල් මිලියනයක පමණ වටිනාකමින් යුත් සනීපාරක්ෂක ඇසුරුම් 500 ක් පරිත්‍යාග කරනු ලැබූහ. ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාත්මක මධ්‍යස්ථාන ප්‍රධානී මෙන්ම යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී වෙත එම පරිත්‍යාග භාරදීම ඉකුත් පෙබරවාරි 09 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී සිදුකෙරිණ.

මෙලෙස පරිත්‍යාග කළ සනීපාරක්ෂක උපකරණ තොගයට පුද්ගලික ආරක්ෂණ උපකරණ, සනීපාරක්ෂක කට්වල, සබන්, දන්තාලේප, දත් බුරුසු, රෙදි සෝදන කුඩු, සනීපාරක්ෂක තුවා, අත් තුවා සහ විෂබීජනාශක දියර බෝතල් 500 ක් ඇතුලත් විය. "Muslim Aid Sri Lanka" ශාඛාවේ අධ්‍යක්ෂ ඒ. සී. ෆයිසර් ඛාන් යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපතිතුමා හමුවී සුහදව අදහස් හුවමාරු කරගැනීමෙන් අනතුරුව මෙම සනීපාරක්ෂක උපකරණ තොගය පරිත්‍යාග කරනු ලැබීය. රට ගෝලීය වසංගතයකට මුහුණ දී සිටින අවස්ථාවක ප්‍රජා වගකීම, ජනවාර්ගික සමගිය සහ සුහදත්වය සංකේතවත් කරමින් සිදුකළ එම පරිත්‍යාග පිළිබඳ යුද්ධ හමුදාධිපති ඔවුන් වෙත සිය කෘතඥතාවය පළකළේය.




# වීරු මෙහෙවර අගයා උතුම් පරිත්‍යාගයක්...

යුද්ධ හමුදා සාමාජිකයින්ගේ ප්‍රයෝජනය සඳහා භාවිතා කිරීමට බංගලාවක් සහිත භූමි භාගයක් ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී මෙන්ම යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී වෙත පසුගිය පෙබරවාරි 25 දින නුවරඑළියේදී පරිත්‍යාග කරන ලදී. මෙම බංගලාව සහිත භූමි භාගය පර්චස් 180.2 ක විශාලත්වයෙන් යුක්ත වන අතර එම පරිත්‍යාගය සිදුකරනු ලැබුවේ අතීතයේ සිට වැවිලි කර්මාන්තයට උරුමකම් කියන නුවරඑළිය ප්‍රදේශයේ ධනවත් ව්‍යාපාරිකයකු වන වතු හිමිකරු දොන් බර්නාඩ් ඇලෝසියස් කුරුකුලාදිත්‍ය සහ ලාලනී බියට්‍රිස් කුරුකුලාදිත්‍ය යන මහත්ම මහත්මීන් විසිනි.

රට දැය වෙනුවෙන් දැඩි කැපවීමෙන් සේවය කරන යුද්ධ හමුදා සාමාජිකයින්ගේ ප්‍රයෝජනය සඳහා මෙවන් පරිත්‍යාගයක් සිදුකිරීම පිළිබඳව යුද්ධ හමුදාධිපතිතුමන් එහිදී එම දෙපළ වෙත සිය ස්තුතිය පුදකළේය.




# උණුසුම් පිළිගැනීමක්...

ශ්‍රී ලංකාව සහ පකිස්ථානය අතර ද්වීපාර්ශවීය අවබෝධය සහ මිත්‍රත්වයේ ශක්තිමත්භාවය ලොවට විදහා දක්වමින් ශ්‍රී ලංකාවට පැමිණි පකිස්ථාන ගරු අග්‍රාමාත්‍ය ඉම්රාන් ඛාන් මහතා කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේදී ඉකුත් පෙබරවාරි 23 වන දින මහත් හරසරින් පිළිගනු ලැබීය.

ගරු ආග්‍රාමාත්‍ය මහින්ද රාජපක්‍ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සිදුවූ එම පිළිගැනීමේ අවස්ථාවට ගරු විදේශ කටයුතු අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන, පකිස්ථාන මහ කොමසාරිස්, විදේශ සබඳතා අමාත්‍යාංශයේ ලේකම් අද්මිරාල් (විශ්‍රාමික) මහාචාර්ය ජයනාත් කොළඹගේ, ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී මෙන්ම යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී සහ තවත් උසස් රාජ්‍ය නිලධාරීන් රැසක් සහභාගී වූහ.

# නිරීක්ෂණ චාරිකාවක්...



රට තුළ පවතින කොවිඩ් 19 තත්ත්වය මධ්‍යයේ වුවද ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය විසින් රණවිරු සුභසාධනය උදෙසා සිය ව්‍යාපෘතීන් නොකඩවා සිදුකරමින් පවතී. ඒ අනුව දැනට ක්‍රියාත්මක ව්‍යාපෘතීන් වලට අමතරව යුද්ධ හමුදාධිපතිතුමන්ගේ උපදෙස් හා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ ගරු සභාපතිනි ගේ අධීක්ෂණය යටතේ යුද්ධ හමුදා සාමාජිකයින් බහුලව රාජකාරී කරනු ලබන දියතලාව ප්‍රදේශයේ අංගසම්පූර්ණ සුභසාධක වෙළඳසැලක් ඉදිකරමින් පවතී. මේ වන විට එහි පවතිවන අවසන් අධියරෙහි ඉදිකිරීම් කටයුතුවල ප්‍රගතිය සොයාබැලීම සඳහා ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී මෙන්ම යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී සහ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ ගරු සභාපතිනි සුජීවා නෙල්සන් මහත්මිය ඉකුත් පෙබරවාරි 25 වන දින එහි සංචාරයක නිරත වූහ.











# නිදහස් දිනය සමරා...

73 වන නිදහස් සමරු උළෙල නිමිත්තෙන් යුද්ධ හමුදා මූලස්ථානයේ පැවති රුක් රෝපණයට සමගාමීව සේවාවනිතා ඒකකයේ ගරු සභාපතිනි සුජීවා නෙල්සන් මහත්මියගේ උපදෙස් මත මුල්ලේරියාව "සන්ෆ්ලවර් විලේජ්" කඳවුරේදීද පැල රෝපනය කිරීමේ වැඩසටහනක් ඉකුත් පෙබරවාරි 05 වන දින පැවැත්විණ.

යුද්ධ හමුදා සේවාවනිතා ඒකකයේ කර්නල් සම්බන්ධීකරණ කර්නල් ටීඑස් බාලසූරිය ගේ ප්‍රධානත්වයෙන් පැවති එම රුක් රෝපණ වැඩසටහනේදී කරද, මී, කොස්, කුඹුක්, අනෝදා හා පොල් ඇතුළු පැල වර්ග 35 ක් රෝපනය කරන ලදී. මෙම අවස්ථාවට යුද්ධ හමුදා සේවාවනිතා ඒකකයේ නිලධාරීන්, නිලධාරිණීන් මෙන්ම සෙසු නිලයින් පිරිසක් ද සහභාගී වූහ.

# ඉංජිනේරු බලකා සේවා වනිතා ශාඛාව...



ශ්‍රී ලංකා ඉංජිනේරු බලකා සේවා වනිතා ශාඛාවේ 13 වන සභාපතිනිය ලෙස රමණා ශිරෝමි අමරසේකර මහත්මිය ඉකුත් පෙබරවාරි 08 වන දින එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේ පිහිටි සිය කාර්යාලයේදී සිය රාජකාරි කටයුතු අරඹන ලදී. මෙම අවස්ථාව සඳහා ඉංජිනේරු බලකා මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් එම් මායාදුන්න ආර්එස්පී යූඑස්පී, එම සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන් ඇතුළු පිරිසක් සහභාගි වූහ.

# සිංහ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාව...






සිංහ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ වාර්ෂික මහ සභා රැස්වීම ඉකුත් පෙබරවාරි 06 වන දින එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති, ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ඩීඑම්එච්ඩී බණ්ඩාර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී සහ සිංහ සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ශිරෝමි බණ්ඩාර මහත්මියගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණි. මෙම අවස්ථාව සඳහා සිංහ රෙජිමේන්තු මධ්‍යස්ථානයේ නිලධාරීන් සහ සිංහ බලකා සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන් රැසක් සහභාගි වූහ.

මෙම අවස්ථාවට සමගාමීව ආබාධිත හා මියගිය රණවිරුවන්ගේ පවුලේ ඥාතීන් වෙනුවෙන් රෝදපුටු, මහන මැෂින්, වෛද්‍යාධාර සහ මූල්‍ය පරිත්‍යාගයක්ද සිදුකළ අතර, පෞරුෂ සංවර්ධන උපදේශිකා හා මනෝ චිකිත්සක/මනෝ උපදේශිකා අමා දිසානායක මහත්මිය විසින් සිදුකළ ඉතා හරවත් සහ කාලෝචිත දේශනයක් ද වැඩසටහනට ඇතුළත් විය.



# විජයබාහු පාබල රෙජිමේන්තු සේවා වනිතා ශාඛාව...



කොමලමුනේ ප්‍රදේශයේ ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියදී ත්‍රස්තවාදීන් විසින් එල්ලකළ ප්‍රහාරයක් හේතුවෙන් තුනටියෙන් පහළ අප්‍රාණික තත්වයට පත්ව දැනට පූර්ණ ආබාධිත සෙබළෙකු වශයෙන් අභිමංසල 111 හි නේවාසික ප්‍රතිකාර ලබන මහියංගනය, දමුණුකැටිය පදිංචි සෙ/518775 කෝප්‍රල් සුසන්ත මිණිපුර එස්එස් ආර්එස්පී යන කොනොනි ගේ නිවසෙහි පැවති ජල ගැටළුවකට පසුගියදා විසඳුම් ලැබිණ. ඒ අනුව විජයබාහු පාබල රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිනියගේ මගපෙන්වීම මත එහි සාමාජිකා ඉරන්ති දිල්රුක්ෂි මහත්මිය සහ කර්නල් පීඑස්එස් සංජීව ආර්එස්පී පීඑස්සී ගේ මිතුරු කැල විසින් සිදුකරන ලද ධන පරිත්‍යාගයෙන් රුපියල් 250,000.00 ක මුදලක් වැයකර එම කොනොනි වෙත නළ ළිඳක් ඉදිකරදෙන ලදී.



# ඉංජිනේරු සේවා සේවා වනිතා ශාඛාව...

ඉංජිනේරු සේවා බලකා සේවා වනිතා ශාඛාවේ මගපෙන්වීම මත එම පුහුණු පාසලේ සාමාජිකයින්ගේ මූලිකත්වයෙන් තොටවියාගම බුද්ධි ඌණතා සහිත දරුවන් සිටින ළමා නිවාසයේ දරුවන් හට මාහැඟි සත්කාර රැසක් සිදුකරන ලදී. ඒ යටතේ එම දරුවන් වෙත දිවා ආහාර වේලක් පිරිනැමුණු අතර, ත්‍යාග සහ වියළි ආහාර ද්‍රව්‍ය පරිත්‍යාගයක්ද සිදුකරන ලදී.







# යුධෝපකරණ බලකා සේවා වනිතා ශාඛාව...

සාලියපුර සතුට ළමා නිවාසයේ විශේෂ ආබාධ සහිත දරුවන් හට දිවා ආහාරය සහ ත්‍යාග ලබාදීමේ මාහැඟි සත්කාරයක් ඉකුත් ජනවාරි 30 වන දින යුද්ධ හමුදා යුධෝපකරණ බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනියගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණ.

# වෛද්‍ය බලකා සේවා වනිතා ශාඛාව...

කොළඹ යුද්ධ හමුදා රෝහලෙහි නේවාසිකව ප්‍රතිකාර ලබන අයවළුන් සඳහා සංවිධානය කෙරුණු නත්තල් කැරොල් ගී ප්‍රසංගයක් පසුගියදා එම රෝහල් පරිශ්‍රයේදී පැවැත්විණ. වෛද්‍ය බලකා සේවා වනිතා සභාපතිනියගේ උපදෙස් පරිදි පැවති මෙම ප්‍රසංගයට ප්‍රධාන අමුත්තා ලෙස වෛද්‍ය බලකා බලකාධිපති සහභාගි විය.

එහිදී නේවාසිකව ප්‍රතිකාර ගනු ලබන රෝගීන් වෙනුවෙන් තිළිණ ප්‍රදානයක්ද සිදුකෙරිණ.







# ගැබිණි මව්වරුන්ට වියළි සලාක...




යාපනය ආරක්‍ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එල්පීඩබ්ලිව් පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ සංකල්පයකට අනුව යාපනය දිස්ත්‍රික්කයේ ජීවත්වන අඩු ආදායම්ලාභී ගැබිණි මව්වරුන් 75 දෙනෙකු සඳහා පෝෂණදායී වියළි සලාක බෙදාදීමේ ප්‍රජාසත්කාරක වැඩසටහනක් චාවකච්චේරි නගරයේ පිහිටි පුමාරි ශාලාවේදී ඉකුත් ජනවාරි 28 වන දින පැවැත්විණ. ආරක්‍ෂක සේනා ආඥාපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් සිදුකරන ලද මෙම ප්‍රජාසත්කාරය සඳහා කොළඹ "තාරනා පදනම" අනුග්‍රහය දැක්වූ අතර, 52 වන පාබල සේනාංකය සහ 523 වන පාබල බලසේනාව විසින් මෙම උත්සවය සංවිධානය කරන ලදී.

# මියගිය විරුවන් සිහිකරමින්...



මෙරට සාම සාධක රාජකාරීන්හි නිරතව සිටියදී මියගිය ඉන්දීය රණවිරුවන් සිහිපත් කරමින් පලාලිහි පිහිටි ඉන්දීය රණවිරු ස්මාරකය වෙත පුෂ්පෝපහාර දැක්වීමේ වැඩසටහනක් ඉකුත් ජනවාරි මස 26 වන දින සිදුකෙරිණ.

ඉන්දීය 72 වන ජනරජ දිනය වෙනුවෙන් පැවති මෙම අවස්ථාවට ඉන්දීය කවුන්සල් ජෙනරාල් යාපනය එස් බාලචන්ද්‍රන් මහතා සහ යාපනය ආරක්‍ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එල්පීඩබ්ලිව් පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ද සහභාගී වූහ. තවද එම අවස්ථාවට ඉන්දීය කොන්සල් ජෙනරාල් කාර්යාලයේ නිලධාරීන්, යුද හමුදා නිලධාරීන් සහ සෙසු නිලයන් රැසක්ද එක්වූහ





# ආඥාපතිගේ සංචාරයක්...





ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති ලෙස වැඩභාරගත් මේජර් ජෙනරාල් ඩීඑම්එච්ඩී බණ්ඩාර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පසුගියදා එම බල ප්‍රදේශයේ ස්ථාපිත 21 වන පාබල සේනාංකයෙහි සංචාරයක නිරත විය.

එහිදී 21 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එච්එල්විඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ උණුසුම් පිළිගැනුම් මධ්‍යයේ සපැමිණි ආඥාපති වෙත එම සේනාංක හටපිරිස් විසින් කඳවුරු සම්මාන මුරයක්ද පිළිගැන්විණ. අනතුරුව විරුකැකුළු පෙරපාසල, ප්‍රාදේශීය යුධ උපකරණ ගබඩා සංකීර්ණය මෙන්ම සේනාංකය යටතේ ස්ථාපිත ඒකකයන් ද ආඥාපතිගේ නිරීක්ෂණයට බඳුන්විය.











# සේනාංකයන්හි සංචාරයක්...

නැගෙනහිර ආරක්ෂක සේනා ආඥාපති ලෙස පසුගියදා රාජකාරි භාරගත් මේජර් ජෙනරාල් සීඩී වීරසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ඉකුත් පෙබරවාරි මස 12, 13 සහ 14 යන දිනයන්හි 24 වන සේනාංක මූලස්ථානයේ සහ 241, 242 වන බලසේනා මූලස්ථානයන්හි සංචාරයක නිරත විය.

එහිදී හටපිරිස් ඇමතූ ආඥාපති කොවිඩ්-19 වෛරසය පැතිරීම වැළැක්වීමේ ජාතික කාර්යභාරයට උරදී කටයුතු කරන සියලුම නිලධාරීන් සහ සෙසුනිලයින් අගය කළ අතර, සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් හටපිරිස් අඛණ්ඩව යහපත් සෞඛ්‍ය මට්ටමක් පවත්වාගැනීමේ වැදගත්කම ද, සෑම විටම වෘත්තීය නිපුණත්වය සහ ඉහළ විනයක් පවත්වාගැනීමේ වැදගත්කම ද අවධාරණය කළේය.



# ක්‍රීඩාවට අත්වැලක්...



කිලිනොච්චි ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් කේඑන්එස් කොටුවේගොඩ එන්ඩීසී අයිජී ගේ උපදෙස් මත එම මූලස්ථානයේ නවතමයෙන් ඉදිකරන ලද ක්‍රීඩාපිටිය විවෘත කිරීම සහ කොනොනි සමාජ ශාලාව ඉදිකිරීම වෙනුවෙන් මුල්ගල තැබීමේ උත්සවය ඉකුත් ජනවාරි 30 වන දින ආරක්ෂක සේනා ආඥාපතිගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණ.

එහිදී එම අවස්ථාවට සමගාමීව නිලධාරීන් සහ සෙසුනිලයින්ගේ සහභාගීත්වයෙන් ආරක්ෂක සේනා මූලස්ථානයේ ප්‍රධාන ශාඛාව සහ පාලන ශාඛා කණ්ඩායම් නියෝජනය කරමින් සුහද සැහැල්ලු පන්දු ක්‍රිකට් තරගාවලියක් ද පැවැත්විණ.



# යටිතල පහසුකම් වැඩිදියුණු කරමින්...

යුද්ධ හමුදා මූලික රෝහල මුලතිව් හි අභිනවයෙන් ඉදිකරන ලද බාහිර රෝගී අංශය හා හදිසි ප්‍රතිකාර ඒකකය ඉකුත් පෙබරවාරි 15 වන දින සුබ මොහොතින් විවෘත කෙරිණ. ආරක්ෂක සේනා (මුලතිව්) ආඥාපති ගේ උපදෙස් හා මඟපෙන්වීම මත ඉතා කෙටි කාලයක් තුළදී සාදා නිමකළ මෙම ඉදිකිරීම් විවෘත කළ අවස්ථාවට එම රෝහලේ නිලධාරී අණදෙන කපිතාන් කේඑස්එස් කෝරාල ගේ ආරාධනයෙන් මුලතිව් ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ආර්එම්පීජේ රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී සහභාගී විය. ඉදිරි නඩත්තු පෙදෙස (මුලතිව්) ආඥාපති මේජර් ජෙනරාල් ආර් ගනේගොඩ පීඑස්සී ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයින් පිරිසක් ද ඊට එක්වූහ.









# සංචාරයක සටහන්...



ශ්‍රී ලංකා පාබල හමුදාවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් කේඩබ්ලිව්ආර් ද ආබෲව් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී එච්ඩීඑම්සී ඉකුත් පෙබරවාරි 17 වන දින 8 වන ශ්‍රී ලංකා පාබල හමුදා ඒකකයෙහි සංචාරයක් සිදුකරන ලදී. එහිදී එම ඒකකයේ නිලධාරීන් සහ සෙසුනිලයින්ගේ අවශ්‍යතා පිළිබඳ සහ ඔවුන්ගේ ඉදිරි අභිවෘද්ධිය සඳහා වූ සියලු පාලන කටයුතු විධිමත්ව සිදුකිරීම පිළිබඳ සොයාබැලූ හෙතෙම එම ඒකක හටපිරිස් ඇමතීමටද ක්‍රියා කළේය.

# නිසට සෙවණක්...



සිරස මාධ්‍ය ජාලයේ "සිරස නිවාස" ප්‍රජාසත්කාරක ව්‍යාපෘතිය යටතේ වූ නවත් පියවරක් ලෙස රත්නපුර, පල්ලෙබැද්ද ප්‍රදේශයේ නවතමයෙන් ඉදිකළ නිවසක් මල්ලිකා දිල්රුක්ෂි යන අය වෙත ඉකුත් පෙබරවාරි 12 වන දින භාරදෙන ලදී. යුද්ධ හමුදාධිපති ගේ මඟපෙන්වීම මත 61 වන පාබල සේනාංකය සහ 611 වන බලසේනාවෙහි සෘජු අධීක්ෂණයෙන් හා 8 වන ගැමුණු හේවා බලඇණියේ සෙබළුන්ගේ ශ්‍රම දායකත්වයෙන් එම නිවස ඉදිකෙරිණ.



61 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩීජී හේවගේ ආර්එස්පී ගේ ප්‍රධානත්වයෙන් පැවති එම නිවස භාරදීමේ උත්සවයට සිරස මාධ්‍ය ජාලයේ සමූහ අධ්‍යක්ෂිකා නීද්‍රා වීරසිංහ මහත්මිය ඇතුළු පිරිසක් සහභාගි වූහ.



# නිදහස් දිනයට රුක් රෝපණයක්...

ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) යටතේ පාලනය වන 12 වන පාබල සේනාංක මූලස්ථානය පසුගිය පෙබරවාරි 04 වන දිනය යෙදී තිබුණු 73 වන ජාතික නිදහස් සැමරුම නිමිත්තෙන් වැඩසටහන් මාලාවක් පවත්වන ලදී.

එහිදී, 12 වන පාබල සේනාංක මූලස්ථානයේ සියළු නිලයින් එක්ව රුක් රෝපණ වැඩසටහනක් පවත්වන ලද අතර, මෙම අවස්ථාවට මධ්‍යම ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් එච්පීඑන්කේ ජයපතිරණ ආර්එස්පී ද සහභාගි විය.





# සිතුවිලි සාගරය



## දයාබර අම්මා...



ගෙවා දසමසක් දුක්විඳ
කටුක දිවියක් මගේ අම්මා
සෙනෙහසින් මා මෙලෙස බිහිකර
සතුටු වූවා කඳුළු වගුරා.....

නෙතට නිදිනැති කුසට බඩගිනි
කොතෙක් විඳ ඇති මා නිසා
මවගෙ ජීවය දෙවෙනි කොටගෙන
මගේ ජීවෙට පළමු තැන දුනි.....

නිතර විමසිලිමත්ව නෙත් හැර
මගේ දියුණුව ගැනම වෙහෙසුනි
දරන්නට ඇති මහමෙරක් මෙන්
මා නිසා දුක් කන්දරා.....

නැති වුනත් මෑණියනි ඔබ අද
සිහි කරන්නෙමි ඔබේ මතකය
උපදිනා හැම භවයකදි මා
තුරුළු වෙන්නෙමි ඔබේ කුසයෙම

එච්. රත්නායක (සිවිල් අංශය)
පොදු ප්‍රවාහන බලසෙනය - 3 ශ්‍රීලයුසේබ
තිසාවැව කඳවුර
අනුරාධපුරය.

## සෑදෙව්..

නිදහස් සිතකට ඉගිකල
නුඹෙ පෙම් ඇස්
සිහින් මකන්නට බැරිබව දනිමින්
එන්නට සිතමින් බලනට
නුඹෙ ඇස්...
කෙලෙස සිටින්නද නොදකින තුරු මා

සෙ/2095376
ආකාසෙ පෙරේරා ජීකේඩීඅයි
6 ශ්‍රීලංසංබ

## විරුවන් නොමැරෙන්නේ...

ගෙවී ගිය අතීතයේ
සිදුවූ සමහර දුක්බර කථා
මා හදවතේ...
වේදනාව නමැති ඉතිහාස පොතට
උරුමකම් කියයි...
ඒ තරම් වේදනාව
ඒ කථා තුළ ගැබ්ගෙන ඇත
ඉතිං ඉවසමි...
දවසක මා හද තුළම
මා එක්කම
ඒ ඉතිහාස පොත විනාශ වෙලා යාවි
සදහටම... කාටවත් නොදැනීම...

සෙ/කිපු104364
ලා/කෝ බංඩාර කේඑම්ඒඑච්
9 ශ්‍රීලංජාඅබමූ

## නුඹ...

නෙත් කොනින් බලා
හිනැහෙන්නී...
මෘදු මොලොක්
වදන් තෙපලන්නී...
අන්සතු මලක්
නොවෙද නුඹ...
දැන දැනත් අහිමි වන බව
කරනු එපා ආලය...
ප්‍රේමය මුලාවකි...

සෙ/2එල්00815
කෝප්‍රල් චතුර කුමාර පීපීඑන්
2(සේවා) ශ්‍රීලයුසේබ

## වීරවරියකි ඔබ...



මව්පියන්ගේ ප්‍රථම සිහිනය වූ ඔබ
අපේ පුංචි පවුලේ ප්‍රථමයා වූ ඔබ
සනුහරේ ප්‍රථම
රූ රැජින වූ ඔබ
අප පරපුරෙන් හමුදාවට ගිය
ප්‍රථම තරුණිය වූ ඔබ
කෝප්‍රල් තනතුරට පත්
ප්‍රථමයා වූ ඔබ
කිසිදා කිසිවිටක දෙවැනි නොවූ ඔබ
මව්බිමේ ඒකීයභාවය වෙනුවෙන්
කුරිරු ත්‍රස්තවාදී බෝම්බය හමුවේ
දිවිදුන් දහසක් හමුදා
සෙබළියන් අතර ද
ප්‍රථමයා වුණා අක්කේ...

ද සිල්වා නිලන්ති
ඇතුල්කොට්ටේ

(1997 ජනවාරි 02 වන දින කිරුළපනදී එල්ටීටීඊ ප්‍රහාරයකින් දිවිපිදූ ප්‍රථම රණවිරුවරිය වූ කෝප්‍රල් ඉරේෂා නිල්මිණීගේ 24 වන ගුණ සැමරුම වෙනුවෙනි)



ලුතිනන් කර්නල් බීජීඑස් සමන්ති විසින් **"එලදායී තාරුණ්‍යය හා ජාතික මෙහෙවර"** යන මැයෙන් ආසේමු (කිලිනොච්චි) හි පැවැත්වූ දේශනය.







මේජර් ටීපීජීකේපී ද අල්විස් ආර්ඩබ්ලිව්පී යූඑස්පී පීඑස්සී විසින් **"අවබෝධය හා දැනුම අතර පරස්පරතාව"** මැයෙන් ආසේමු (යා) හි පැවැත්වූ දේශනය.



ලුතිනන් කර්නල් බීජීඑස් සමන්ති විසින් **"එලදායී තාරුණ්‍යය හා ජාතික මෙහෙවර"** යන මැයෙන් ආසේමු (යා) හි පැවැත්වූ දේශනය.



# මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයෙන්

# දේශන මාලාවක්...

මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂක මණ්ඩලයේ අධ්‍යක්ෂක බ්‍රිගේඩියර් ජීඩබ්ලිව්ජී සෙනෙවිරත්න යූඑස්පී පීඑස්සී ගේ උපදෙස් හා මඟපෙන්වීම මත යුද්ධ හමුදා සාමාජිකයින්ගේ චිත්ත ධෛර්යය ඉහළ නැංවීම, ආචාර ධර්මීය ප්‍රතිචිග්‍රහය, යුද්ධ හමුදා ජීවිතය මෙන්ම පුද්ගලික ජීවිතය කළමනාකරණය කරගැනීම, පෞරුෂත්ව වර්ධනය හා මානසික ඒකාග්‍රතාවය පවත්වාගෙන යාම සඳහා වූ විවිධ වැඩමුළු රාශියක් දිවයින පුරා පිහිටි යුද්ධ හමුදා අංශ, ආයතන කේන්ද්‍ර කර ගනිමින් මේ වන විට අරඹා ඇත. ඒ යටතේ වූ තවත් අධියරක් ඉකුත් පෙබරවාරි 16 සහ 17 යන දෙදින ආරක්ෂක සේනා මූලස්ථානය යාපනයේදී ද 18 සහ 19 යන දෙදින ආරක්ෂක සේනා මූලස්ථානය කිලිනොච්චිය හිදී ද පැවැත්විණ.

එහිදී ලුතිනන් කර්නල් බීජීඑස් සමන්ති ජායීබ විසින් "එලදායී තාරුණ්‍යය හා ජාතික මෙහෙවර" යන මැයෙන්ද මේජර් ටීපීජීකේපී ද අල්විස් ආර්ඩබ්ලිව්පී යූඑස්පී පීඑස්සී විසින් "අවබෝධය හා දැනුම අතර පරස්පරතාව" මැයෙන්ද මේජර් සුජිත් චමින්ද එදිරිසිංහ විසින් "යුධ සාහිත්‍යය" පිළිබඳවද දේශන පවත්වනු ලබයි.







මේජර් සුජිත් චමින්ද එදිරිසිංහ විසින් ආසේමු (යා) සහ ආසේමු (කිළි) හි පැවැත්වූ **"යුධ සාහිත්‍යය"** දේශනය.

# වැඩමුළුවක්





64 වන පාබළ සේනාංක මූලස්ථාන බලප්‍රදේශයේ රාජකාරි කරනු ලබන හටපිරිස් වෙත "කාර්ය බහුල ජීවිතය තුළ මුහුණ දෙන ගැටලු ජයගෙන ජීවිතය සාර්ථක කර ගැනීම" පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් ඉකුත් ජනවාරි 30 වන දින පැවැත්විණ. එහි සේනාංකාධිපති මේජර් ජෙනරාල් එම්පී කරුණාරත්න අයිජී ගේ මගපෙන්වීම මත කොළඹ ශික්ෂණ රෝහලේ මනෝ විද්‍යාව පිළිබඳ උපදේශක ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ මනෝ විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මනෝ වෛද්‍ය චෙනුර පලිහවඩන මහතා විසින් එම වැඩමුළුව මෙහෙයවන ලදී.





# යුදබිමේ ඔබ තනිකළේ නැත කිසි දිනේ...

ඔවුන්ට රටේම සෙනෙහස හිමිය. ලෙයින් මසින් සැදුණු ඔවුන් සැබැවින්ම අපේ එවුන්ය. ගතින් දුර්වලව් සිටියද ඔවුන් තමවත් මනසින් ශක්තිමත්ය. තරුණ ජවය තවමත් ඔවුන් සතුය. ඒ ජවය ලොවට පිළිබිඹු වන්නේ විශේෂ අවස්ථාවලදී පමණි. අප මේ කතාකරන්නට යන අපේ කතානායකවරුන් අන් කවරකුත් නොවේ. ඔවුන් යුද්ධයෙන් රණක්ෂිතයට පත් වූ එසේත් නැත්නම් රණක්ෂිතයට පත් විරෝධාර රණවිරුවන්ය.

යුද්ධය අවසන් වී ගතවූ වසර කිහිපය තුළ රණවිරු සුබසාධන කෙරෙහි වැඩි ප්‍රමුඛත්වයක් දී කටයුතු සිදුවන අතර, යුද්ධය පැවැති සමයේ පවා ආරක්ෂක අමාත්‍යාංශය යටතේ විවිධ රණවිරු සුබසාධන ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක විය. "අපි වෙනුවෙන් අපි" අරමුදල යටතේ රණවිරුවන්ට නිවාස ඉදිකරදීමේ ව්‍යාපෘතියද එහිදී ප්‍රමුඛස්ථානයක් ගනී.

කායදානය දී පූර්ණකාලීනව රණක්ෂිතයට පත්ව සිටින යුද හමුදා රණවිරුවන්ට සියලු ප්‍රතිකාර, වෛද්‍යාධාර, ඇපලපස්ථාන ආදියෙන් සමන්විත අංගසම්පූර්ණ සුබෝපභෝගී සුවසහන නිකේතනයක් අනුරාධපුරයේ ඉදිකිරීම මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කෙරුණි. එලෙස ඉදිකෙරුණු අනුරාධපුර "අභිමන්සල" 2011 ජූලි 26 දින විවෘත කෙරුණු අතර අදවන විට එහි නිලධාරීන් දෙදෙනෙකු සහ සෙසු නිලයින් 37 දෙනෙකු නේවාසිකව ප්‍රතිකාර ලබති. 2012 නොවැම්බර් 10 "අභිමන්සල" දෙවැනි අදියර කඹුරුපිටියේදී විවෘත කෙරුණු අතර අදවන විට සෙසු නිලයින් 38 දෙනෙකු එහි නේවාසිකව ප්‍රතිකාර ලබයි. කුරුණෑගල පාංගොල්ලේදී ද 2014 අප්‍රේල් මාසයේ 25 වැනි දින විවෘත කෙරුණු "අභිමන්සල" තුන්වැනි අදියරෙහි මේවන විට නිලධාරීන් සිව්දෙනෙකු සහ සෙසු නිලයින් 34 දෙනෙකු ප්‍රතිකාර ලබති.

එසේම 2011 මැයි මාසයේ 30 වැනි දින විවෘත කෙරුණු "මිහිඳු සෙත් මැදුරත්" 1990 ඔක්තොම්බර් 10 වැනි දින විවෘත කෙරුණු රාගම "රණවිරු සෙවණත්" ආබාධිත රණවිරුවන් වෙනුවෙන් සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරමින් තිබේ. ඒ අනුව රණවිරු සෙවණෙහි මේවන විට නිලධාරීන් 04ක් සහ සෙසු නිලයන් 114 ක් ප්‍රතිකාර ලබමින් සිටින අතර මිහිඳු සෙත් මැදුරෙහි නිලධාරීන් 4ක් සහ සෙසු නිලයින් 38 ක් නේවාසික ප්‍රතිකාර ලබයි.

එසේම, ඒ ආබාධිත රණවිරුවන් වෙනුවෙන් වත්මන් යුද්ධ හමුදාධිපතිතුමාද සුවිශේෂ අවධානයක් යොමුකර ඇත. රණවිරු සෙවණ, අභිමංසල, මිහිඳුසෙත් මැදුර වැනි ආබාධිත රණවිරු පුනරුත්ථාපන මධ්‍යස්ථාන වෙත ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී මෙන්ම යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ද හැකි සෑම අවස්ථාවකම සංචාරය කරන්නේ ආබාධිත රණවිරුවන්ගේ මානසිකත්වය සෑම විටෙකම උසස් මට්ටමක පවත්වාගැනීම සඳහාය. එසේම අබාධිත විරෝදාර රණවිරුවන් දිවි ඇතිතෙක් රැකබලා ගැනීම සහ ඔවුන් කායිකව මානසිකව සහ අධ්‍යාත්මිකව පුනරුත්ථාපනය කර සමාජයට වැඩදායී පුද්ගලයෙකු බවට පත්කිරීම ඒ ආයතන කටයුතු කළ යුතුය යන අරමුණින් යුද්ධ හමුදාධිපතිතුමා කටයුතු කරන නිසාය.

මෙලෙස රණක්ෂිතයට පත් රණවිරුවන්ගේ සුබසාධනය වෙනුවෙන් "රණවිරු සෙවන" ඉටුවන සේවය අතිමහත්ය. ඇස් ඉස් මස් ලේ මව්බිමට දන්දී, ලේවගුරා සටන් බිමෙන් සමුගත් දවසට ඒ රණවිරුවන්ට සෙවණ වෙන සොඳුරු පියස "රණවිරු සෙවණ" යැයි කීම වරදක් නොවේ. 1992 වර්ෂයේ සිට 2020 වර්ෂය වනවිට රක්ෂිතයට පත් රණවිරුවන් 9259 දෙනෙකු ලියාපදිංචි වී ඇත. ඒ අතර කකුල උකුළ ප්‍රදේශයෙන් ඉවත්කල රණවිරුවන් දහයක් සිටිති. එසේම දණහිසට ඉහළින්

කකුල ඉවත්කළ 664 දෙනෙකු සිටින අතර ඉන් 25 දෙනෙකුගේම දණහිසට ඉහලින් කකුල් දෙකම ඉවත්කර ඇත.

එසේම 4095 දෙනෙකු දණහිසෙන් පහළ කකුළ ඉවත් කර ඇති අතර ඉන් 50 දෙනෙකුගේම කකුල් දෙකම ඉවත් කර ඇත. වළලුකර අසලින් පාද ඉවත් කළ 350 දෙනෙකු ඒ අතර සිටින අතර අත වැලමිටට ඉහලින් ඉවත් කළ පිරිස 129 කි. එසේම වැලමිටට පහලින් 249 දෙනෙකුගේ අත ඉවත් කර ඇති අතර ඉන් 21 දෙනෙකුගේ දැතම වැලමිටට පහලින් ඉවත් කර ඇත. එසේම ශල්‍යය සපත්තු සහ උපකරණ 3756 දෙනෙකු වෙනුවෙන් ලබා දී ඇත.

මොවුන්ට සපයන සියලුම පහසුකම් නොමිලයේ සැපයෙන අතර වාර්ෂිකව කෘත්‍රිම පාද සඳහා ලබාදෙන මේස් යුගල 06ක් ලබාදේ. යම් හෙයකින් වසරක් තුළ අවශ්‍යතාව කුට්ටම් හය අභිබවා ගියහොත් එවිටද එම අවශ්‍යතාව සැපිරීමට රණවිරු සෙවණ සූදානම්ය.

එසේම මීට පෙර දණහිසෙන් පහලින් කකුල ඉවත් කළ අයවළුන් සඳහා ලබාදෙන කකුල් ප්‍රමාණය දෙක දක්වා ඉහල දැමීමට කටයුතු කරන්නැයි යුද්ධ හමුදාධිපතිතුමා දන්වා තිබේ.

එසේම අම්පාර, කුරුණෑගල, පොලොන්නරුව, බදුල්ල, මොනරාගල, මහනුවර, අනුරාධපුර, වැනි කොළඹින් දුර බැහැර ප්‍රදේශවල වාසය කරන අබාධිත රණවිරුවන්ට සපයන සේවාවන් ඉහළ දැමීම වෙනුවෙන් අභිමංසල 1 - අනුරාධපුර, අභිමංසල 2- පාංගොල්ල ( කුරුණෑගල) හි විකලාංග සජ්ජුකාරක සහ අංගාදේශක කාර්මිකාගාරවල ප්‍රාදේශීය ශාඛාවන් ආරම්භ කිරීමටද යුද්ධ හමුදාධිපතිතුමා ලබාදුන් උපදෙස් ක්‍රියාවට නංවා ඇති අතර, ගාල්ල කරාපිටියේ පිහිටි " සැනසුම" පරිශ්‍රයෙන්ද රණක්මිතයට පත් රණවිරුවන්ට පහසුකම් සැලසීම සිදු කෙරේ. එසේම ඉදිරියේදී මහනුවර, වැල්ලවාය, අම්පාර ප්‍රදේශවලද ඉක්මනින්ම මේ ප්‍රාදේශීය මධ්‍යස්ථාන ඉදිකිරීමට අපේක්ෂිතය.

මේ ප්‍රාදේශීය මධ්‍යස්ථානවලින් රණක්මිතයට පත් රණවිරුවන්ගේ වාර්ෂික නිකුත් කිරීම්, කෘත්‍රිම පාද හා අත්වල සුළු අළුත්වැඩියාකිරීම් සිදුකරගත හැක. ඒ තුළින් රණක්මිතයටපත් රණවිරුවන්ට සපයන පහසුකම් තවත් ත්‍රීව්‍ර කිරීමේ අවස්ථාව උදාවනවා සේම එය රණක්මිතයට පත් රණවිරුවන්ට පහසුවකි.

රණවිරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ව්‍යාපෘති අතුරින් සුවිශේෂීම ව්‍යාපෘතිය වන්නේ නිවාස ව්‍යාපෘතින්ය. මෙහිදී වැඩසටහන් කිහිපයක් යටතේ නිවාස ව්‍යාපෘති ක්‍රියාවට නැංවේ. "සත්විරු සංහිඳ", "අපි වෙනුවෙන් අපි" පූර්ණ හා අර්ධ නිවාස, මෙත් සෙවණ අර්ධ නිවාස, "විරු සුමිතුරු" පූර්ණ සහ අර්ධ නිවාස සෑදීම සඳහා ශ්‍රම දායකත්වය ලබාදීම, යුද්ධ හමුදාධිපතිගේ සංකල්පයක් මත ක්‍රියාත්මක විශේෂ නිවාස ව්‍යාපෘතිය මගින් පූර්ණ හා අර්ධ නිවාස ලබාදීම, රණවිරු ගම්මාන තුළින් නිවාස ලබාදීම හා එම ගම්මානවල පාලන කටයුතු සිදුකිරීම ආදී ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබයි.

මීට අමතරව යුද්ධ හමුදාධිපතිගේ සංකල්පයක් මත ක්‍රියාත්මක කෙරෙන විශේෂ රණවිරු නිවාස ව්‍යාපෘතිය මගින් 2009.05.18 දිනට පෙර යුද්ධ හමුදාව වෙත බැඳී ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියදී මියගිය තුවාල ලැබූ රණවිරුවන්, වෙනත් හේතුන් මත හා ක්‍රියාන්විත නොවන ප්‍රදේශයන්හි වෙනත් හේතුන් මත මියගිය රණවිරුවන්, ස්වභාවික ව්‍යසනයන්ට ලක්වීම හේතුවෙන් නිවාස ආපදාවන්ට ලක්වූ රණවිරුවන්, විශේෂ අවශ්‍යතා ඇති දරුවන් සිටින රණවිරුවන්, විශේෂ ක්‍රීඩා දක්ෂතා දක්වා ඇති රණවිරුවන්, නිවසක් තනා ගැනීමට නොහැකි ඉතා දුෂ්කර ආර්ථික පසුබිමක් පවතින රණවිරුවන් කෙරෙහි ප්‍රමුඛත්වයක් ලබාදෙනු ලබයි.

මෙත් සෙවණ අර්ධ නිවාස ව්‍යාපෘතිය යටතේ යුද්ධයෙන් මියගිය රණවිරුවන්ගේ පවුල් හා ක්‍රියාන්විතයේදී තුවාල ලැබූ 2009.05.18 දිනට පෙර සේවයට බැඳුණු රණවිරුවන් මේ සඳහා තෝරාගන්නා අතර, අදාළ සම්බන්ධීකරණ නිලධාරියාගේ අධීක්ෂණය යටතේ ප්‍රමාණ සමීක්ෂකවරයෙකු යොදවා රු:750,000.00 ක උපරිමයකට යටත්ව නිවාස තනා ගැනීම සඳහා එම මූල්‍ය ප්‍රතිපාදන අදියර 3 ක් යටතේ ලබාදීම සිදුකරයි.

එසේම ඉඩමක් හෝ නිවසක් නොමැති ක්‍රියාන්විත හේතුන් මත මියගිය/ ආබාධිත (විශ්‍රාමික) / ආබාධිත (සේවයේ නියුතු) යුද හමුදා සාමාජිකයින් වෙත සහ 2009.05.19 දිනට ප්‍රථම යුද්ධ හමුදාව වෙත බැඳී වසර 05 කට අධික සේවා කාලයක් ක්‍රියාන්විත ප්‍රදේශවල රාජකාරී ඉටුකර විශ්‍රාමික රණවිරුවන් වෙනුවෙන් ඉඩම් ලබාදීමේ වැඩසටහනක් ද මේ වන විට ක්‍රියාවට නංවා ඇති අතර, ආබාධිත තත්වයට පත්වූ රණවිරුවන් හට ලංකා ගමනාගමන කොමිෂන් සභාව සමග සම්බන්ධතාවයෙන් නිදහස් බස් ගමන් බලපත්‍ර සහ දුම්රිය අධිකාරිය සමග සම්බන්ධතාවයෙන් දුම්රිය ගමන් බලපත්‍ර ලබාදීම සිදුකරනු ලබයි.

විරුසර කාඩ්පත මගින් පාරිභෝගික සැපයුම්, බැංකු මූල්‍ය හා කල්බදු, රක්‍ෂණ, සන්නිවේදන, අධ්‍යාපන හා වෘත්තීය පුහුණු, සෞඛ්‍යය හා ප්‍රවාහන ඇතුළු විවිධ අංශ හරහා භාණ්ඩ හා සේවාවන් ලබාගැනීමේ සුවිශේෂ ප්‍රතිලාභ සහ සැලකිය යුතු වට්ටම් මෙන්ම සේවා ප්‍රමුඛත්වය ද හිමිකර ගැනීමට ඉඩ සලසා ඇත. මේ මගින් ක්‍රියාන්විත සේවයේ යෙදී සිට දිවිපිදූ, අතුරුදහන් වූ, ආබාධිත, 1983 සිට 2009 වර්ෂය දක්වා යහපත් පැවැත්මෙන් යුතුව සේවයේ නියුතුව සිටි දැනට සේවයේ නියුතු සහ විශ්‍රාමික යුද්ධ හමුදා සාමාජිකයින් වෙනුවෙන් පහසුකම් සලසා ඇත.

ඉන් නොනැවතී මියගිය සහ ආබාධිත රණවිරුවන්ගේ දූ දරුවන් සඳහා ශිෂ්‍යත්ව ලබාදීම ආරක්ෂක අමාත්‍යාංශය වෙතින් සහ රණවිරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් සිදුකරන අතර ඒ මගින් මේවන විට ශිෂ්‍යත්ව විභාගය සමත්, 1 වසර සිට 13 වසර දක්වා ඉගෙනුම ලබන දූ දරුවන් 3063ක් වෙනුවෙන් ශිෂ්‍යත්ව ලබාදී ඇත.

එසේම වෘත්තීමය කුසලතාවයන් සංවර්ධනය කර යුද්ධ හමුදා සක්‍රිය සේවයෙන් විශ්‍රාම යාමෙන් පසු රැකියා අවස්ථා සඳහා යොමුකිරීමේ ව්‍යාපෘතිය යටතේ විශ්‍රාම පූර්ව පාඨමාලා සඳහා යුද්ධ හමුදා සාමාජිකයින් 1401 දෙනෙකු මේවන විට යොමු කර ඇත.

මේ සියල්ල ක්‍රියාවට නැංවෙන්නේ ක්‍රියාන්විත රාජකාරියේදී යුද්ධයේදී මියගිය සහ ආබාධිත තත්වයට පත්වූ යුද හමුදා සාමාජිකයින්ගේ සහ ඔවුන්ගේ ළඟම ඥාතීන්ගේ ජීවන තත්වය නගාසිටුවීමත් විශ්‍රාම යාමට නියමිත යුද්ධ හමුදා සාමාජිකයින් විශ්‍රාම යාමට පෙර හොඳ වැටුපක් සහිතව විශ්‍රාම දිවිය ප්‍රතිඵලදායිව සහ සතුටින් ගත කිරීමට ඔවුන්ගේ ජීවන තත්වය නවදුරටත් නගා සිටුවීමත් යුද හමුදාවේ වගකීමක් ලෙස සලකමින් ඒ වෙනුවෙන් බැඳී සිටින නිසාවෙනි.

**ලුතිනන් දිලංකා ගුණතිලක,**
**ජනමාධ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලය,**
**යුද්ධ හමුදා මූලස්ථානය.**

# දිරිය දරුවන්ට ඉගෙනුමට අත්වැලක්...




වන්නි ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ඩීඑම්එච්ඩී බණ්ඩාර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ සංකල්පයකට අනුව 21 වන පාබල සේනාංකයේ සේනාංකාධිපතිගේ උපදෙස් හා මගපෙන්වීම මත ප්‍රවීණ ක්‍රිකට් ක්‍රීඩක රොෂාන් මහානාම හා ව්‍යාපාරිකයෙකු වන ලක්ෂ්මන් මහානාම යන මහත්වරුන්ගේ ධන පරිත්‍යාගයෙන් එම සේනාංක බලප්‍රදේශයේ මරමඩු රජයේ සිංහල මිශ්‍ර පාසලේ බුදු මැඳුරක් ඉදිකර ඉකුත් ජනවාරි 16 වන දින විවෘත කරන ලදී. එදින විද්‍යාලයේ ඉගෙනුම ලබන දරුදැරියන්ගේ අධ්‍යාපන කටයුතු වෙනුවෙන් රොෂාන් මහානාම සහ දානපතීන් කණ්ඩායම විසින් කරන ලද දායකත්වය මත පරිගණක යන්ත්‍ර දෙකක්ද පරිත්‍යාග කරන ලද අතර එම උත්සවය 5 (සෙව්) ශ්‍රීලපාහ ඒකකයේ හටපිරිස් විසින් සංවිධානය කරන ලදී. එම අවස්ථාව සඳහා 21 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ, 213 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ඇතුළු නිලධාරීන් හා සෙසුනිලයින් රැසක් සහභාගී වූහ.




213 වන පාබල බලසේනා බලප්‍රදේශයේ මහවිලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් දුනුමඩලාව කදුරුපිටිය අ/අශෝකමාලා විද්‍යාලයේ ඉගෙනුම ලබන දරුදැරියන්ගේ අධ්‍යාපන කටයුතු සාර්ථකව සිදුකරගැනීමට අත්වැලක් වෙමින් ඔවුන් හට පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් ජනවාරි 13 වන දින එම විද්‍යාලයේදී සිදුකරන ලදී.

ඒ අනුව 21 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ සෘජු සම්බන්ධීකරණයෙන් හා 213 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් කේඒඑන් රසික කුමාර පීඑස්සී ගේ අධීක්ෂණය යටතේ ඕස්ට්‍රේලියාවේ වෙසෙන ශ්‍රී ලාංකික කණ්ඩායමක් විසින් සිසු දරුදැරියන් 94 දෙනෙකු සඳහා රු: 130,000.00 ක් වටිනා පාසල් උපකරණ එලෙස බෙදාදෙන ලදී.

# ඉගෙනුමට දිරියක්....

මුලතිව් දිස්ත්‍රික්කයේ ස්ථාපිත එකම සිංහල පාසල වන කෝකිලායි සිංහල විද්‍යාලයේ සිසු සිසුවියන්ගේ අධ්‍යාපන කටයුතු නංවාලීමේ උදාරතර අරමුණෙන් සංවිධානය කෙරුණු වැඩසටහන් රැසක් පසුගිය ජනවාරි මස 27,28 හා 29 වන දිනයන් හිදී එම විද්‍යාලයේදී පැවැත්විණ. 59 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එම්පී ලමාහේවා යූඑස්පී ගේ මග පෙන්වීම යටතේ හා 593 පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් ඩබ්ලිව්ඩබ්ලිව්එම්ඩබ්ලිව්ඩබ්ලිව්බීආර් පාලමකුඹුර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ අධීක්ෂණය යටතේ එම වැඩසටහන් මාලාව පැවැත්විණ.



නව පාසල් ආරම්භය සඳහා පාසල් භූමිය විෂබීජ හරණය කිරීම, පාසලේ ප්‍රතිසංස්කරණ කිරීමේ වැඩ කටයුතු සිදු කිරීම, ගුරුකන්ද රජමහ විහාරයේ ප්‍රයෝජනය සඳහා වියළි සලාක තොගයක් පරිත්‍යාග කිරීම. කෝකිලායි සිංහල විද්‍යාලයේ ඉගෙනුම ලබන සිසු සිසුවියන් 94 දෙනෙකු සඳහා එක් සිසුවකුට රු:5000.00 කට අධික වටිනාකමකින් යුත් පාසල් උපකරණ කට්ටලය බැගින් බෙදාදීම යන වැඩසටහන් එහිදී සිදුකරන ලදී.






64 වන පාබල සේනාංක මූලස්ථාන බල ප්‍රදේශයේ ඇති සම්මලන්කුලම් රජයේ දමිළ මිශ්‍ර විද්‍යාලය, ඔඩ්ඩුසුඩාන් සින්නසාලම්බන් විද්‍යාලය, සින්නසාලම්බන් ඊස්වරන් විද්‍යාලය සහ කරිපට්ටමුරිප්පු රජයේ දමිළ විද්‍යාලය යන විද්‍යාලයන්හි අධ්‍යාපනය ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් 350 ක් සඳහා රුපියල් ලක්ෂ 03 ක වටිනාකමකින් යුත් පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක් 64 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එම්පී කරුණාරත්න අයිජී ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් ජනවාරි 27 වන දින සිදුකරන ලදී.




මෙම අවස්ථාව සඳහා 642 සහ 643 පාබල බලසේනාවන්හි බලසේනාධිපතිවරු මෙන්ම ඔඩ්ඩුසුඩාන් ප්‍රාදේශිය ලේකම් ඩී අකිලන් මහතා ද සහභාගී වූහ.



# සොබාදහමේ නිවසක අසිරිය....

නිදහසේ වාසය කළහැකි තැනක් වේ නම් යමෙකුට එය ඔහුගේ නිවසයි. අපමණ වූ නිදහසක්, දොර ජනෙල් තුළින් එන, වාතය පවා නවතා නිවසේ දී නිදහස විඳිය හැකිය. ඔබ පුළුල්ව සිතුවහොත්, නිවස නිවහන ගැන ඔබට බොහෝ දේ සිතේ. නිවසක් සම්පූර්ණ වන්නේ වහල, බිත්තිය හා පාදම යන අංග තුනකිනි. නිවසක් ගෙදරක් කළ යුතුනම්, ගෙවිලියක් දරුවන් ආරක්ෂා කළ යුතුය. එවිට නිවසක් ගෙදරක් වේ. නිවසට කැඳවා ගනු ලැබූ ලිය "ගෙවිලිය" වේ. ඇයගේ ජනිතයින්, දර්ශනය වූ ධාරණය වූ මැණික්ය. ඒ දරුවන් වේ. දරුවන් ජනිත වී හදාවඩා ගැනුමට නම් සිව් බඹ විහරණ තිබිය යුතුය. දරුවන් වෙත මහත් වූ කරුණාවෙන්, මෛත්‍රියෙන්, මුදිතාවෙන් හා උපේක්ෂාවෙන් පෝෂණය කරමින් ජීවන ගමන රැගෙන යා යුතුය. එවිට ඔවුන් ඔවුන්ගේ දරුවන් සිව් බඹ විහරණයෙන් සුරක්ෂා කරයි. එවිට දෙවන බුදුන් ගෙදර රැඳී සිටියි. ඒ දෙමාපියන් වේ. සිව් බඹ විහරණයෙන් පෝෂණය වී සුරැකෙන ගෙදර පන්සලකට සමාන වේ. එබැවින් පවුල් පන්සල් යන යුගල පදයෙන් ගෙදර හැඳින්වේ. පන්සලකට සිව් බඹ විහරණය පතා එන උවැසියන් සේ පවුලේ සාමාජිකයින් යහගුණයෙන් සැදි දම්වැලකින් බැඳී තිබිය යුතු වේ. ගුණ දහමින් පිරිපුන් පවුල්, පන්සල් වී දැහැමින් සමාජය නිර්මාණය වේ. ගෙදරක නව ජනිතයින් බිහිවීමෙන් තම පරපුර සංස්කෘතිය ගොඩනැගීමට ඉවහල් වෙති. නිවසක අසිරිය මෙසේ පන්සලක් වී වර්ධනය වන්නේ තමාගේ සතුට දනවන සුවපහසු නිවහනක් සිතට ලඳොත් පමණකි.

නිවැරදිව නිර්මාණය කරගත් නිවසකින් පුද්ගලයාගේ පරිපූර්ණ දර්ශනය වේ. එවන් අසිරිමත් නිවසක හිමිකම්ලාභීන් දෙස බලන මිනිසුන්, ජීවත් වීමට ස්වෝත්සාහයෙන් නිවාස ඉදිකර ගනී. ඒවා විවිධ හැඩයෙන්, ප්‍රමාණයෙන්, ස්වරූපයෙන් හා වර්ණයෙන් යුක්ත වේ. එමෙන්ම එම නිවාසවල ස්වරූපය අනුව ජීවත් වන්නන්ගේ චර්යාවන් සිතු පැතුම් ක්‍රියාකාරකම් ද විවිධ ස්වරූපයන්ගෙන් යුක්ත වේ. එම නිවාස තුළ ජීවත් වන නිවැසියන් කායික මානසික තෘප්තියෙන් ජීවත් වීමට අපේක්ෂා කරයි. කෙසේ වෙතත් උත්සාහයෙන් නිවසක් ඉදිකර ගනු ලැබූ මිනිසුන් හැර තවත් නිවාස ඉදිකරගෙන ජීවත් වන සත්වයෝ ලෝකයෙහි ජීවත් වෙති. ඒ ඒ සත්ව වර්ගයට ගැලපෙන එම චර්යාවන් පිලිබිඹුවන ඔවුන් ජීවත් වන පරිසරයට ගැලපෙන ඔවුන්ට ආවේණික වූ ක්‍රමවේදයකට නිවාස තනාගෙන ජීවත් වේ, මෙම ජීවී නිවාස ප්‍රධාන කොටස් 04 කට බෙදා දැක්විය හැකිය. ඒවා ගෙවල්, ගුහා, කූඩු හා නවාතැන් ලෙස හඳුන්වයි.

නිවසක් වහල, බිත්ති හා පාදම යන අංග 03 කින් සමන්විත බව පෙර කීවෙමි. එවැනි අංග සම්පූර්ණ නිවසක නිවැසියෝ, මනසින් පිරිපුන් වූවන්ය. ඔවුන් නිර්මාණශීලි වූවෝය. ඒ ආහාරය සඳහා හෝ යැපීම සඳහා නොව මතු පරපුරේ උන්නතිය හා සුරක්ෂිතතාවය සඳහා ඔවුන් නිර්මාණකරුවෝය. ඒ අනුව පරිපූර්ණ නිවසක හිමිකරුවන් වන්නේ මිනිසුන්ය. මිනිසුන් බිහිවීමේදී කුඩා දරුවෙකු ලෙසින්, විවර වූ නෙත් ඇතිව ජනිත වී කිරි උරා බොමින්, කාලයක් සමඟ මවගේ ඇකයේ, උණුසුමේ වැඩෙමින්, ළදරු කාලය ගෙවමින් ළමා කාලයකටද, ගැටවර වයසටද, තාරුණ්‍යයටද, මැදිවිය ඉක්මවමින් මහළු වියට එළඹ ක්‍රමිකව දත් හැලී, හිසකෙස් හැලී පංචේන්ද්‍රයන්

වයසට ගොස් ජීවන ගමන මහළු වූ ළදරුවෙකුට සමාන ලෙසින් ගත කරමින් ජිවිතය නිමා කරයි. ඔවුන් පරපුරේ ලේ නෑකම් වර්ධනය කරයි. ඥාතිත්වයේ සංස්කෘතියක් භාෂාවක් සිරිත් විරිත් සමූහයකින් බුද්ධිපූර්ණය කර ගනී. සත්වයින්ගේ ඉහළම කොටස නියෝජනය කරන මනුෂ්‍යයන් වශයෙන් ඔවුන් ජිවත් වේ. නිවසේ ස්වභාවය මිනිසුන්ගේ ගති සිරිත් පැවතුම් හා චර්යාවන් මෙහෙයවීමට සෘජු ලෙසම දායක වේ.

ගුහා ලෙස හඳුන්වන්නේ පාදමක් සහ බිත්තියකින් සම්පූර්ණ වූ නිවාසය. වහලයද ආවරණය වී ඇත්තේ බිත්තියෙන්ම වේ. මෙම ගුහාවලට වෙනම සකස් වූ වහලක් නැත. වහල ලෙස ඇත්තේ බිත්තියෙන්ම ආවරණයක් වූ වහලකි. බොහෝ ක්ෂීරපායි සතුන්ගෙන් නපුරු යැයි හැඟෙන කොටි වලසුන් සිංහයන් වැනි සතුන් ජිවත් වන්නේ මෙම ගුහා ඇසුරුකොට ගනිමිනි. පූර්වයේ යක්ෂයන් වැනි අමනුෂ්‍යයන් ජීවත් වූ බවද ව්‍යවහාරයේ දක්වේ. මිනිසුන්ගේ සිතුම් පැතුම් හඳුනා ගැනීමේ අත්දැකීම් මත ගුහා යුගයෙන් ඉවත් වූ මිනිසුන් පූර්ණ වූ නිවාස කරා පැමිණ ඇත. මෙම ගුහා තුළට ඇතුල්වීමට ගුහා විවරයක් නැතහොත් එක් කවුලුවක් පමණක් බොහෝ විට ඇත. අඳුරු ස්වභාවයක් ගන්නා මෙම ගුහාවලට හිරු එළිය ලැබීම බොහෝ විට වැළකී ඇත. මෙහි උපදින්නෝ ඉන්දි මඳ කලක් යනතෙක් ඇස් විවර නොවන්නෝය. එම සතුන්ගේ දරුවන් ළදරු කාලයක් ගෙවා මව් පිය පුරුදු පුහුණුවීම් තුලින් තම ජිවිකාව ගෙන යාම සඳහා කාල පරාසයකින් ඉගෙන ගන්නෝය. මොවුන් බොහෝ විට සිව්පාවුන් වේ. මොවුන්ගේ ප්‍රධාන ආහාරය මාංශ වන අතර සමහර සතුන් ශාක භක්ෂණයේද යෙදෙති.

ගුහා වල උප විශේෂයක් ලෙස බෙන හඳුන්වා දිය හැකිය. පාදමක් රහිත බිත්තියෙන්ම ආවරණය වී ඇති නිවාස බෙන වේ. මේවා තුළ පා අහිමිවූවන්, සර්පයන්, උරගයින්, උභයජීවීන් සහ දෙපාවන් වූ පක්ෂින් විශේෂ ද ජිවත් වේ. මොවුන් මාංශ භක්‍ෂකයෝ වෙති. බෙනවල ජිවත් වන බොහෝ සතුන් උපත ලබන මොහොතේදීම තම මව හෝ පියා එම සතුන්ගේ පැවැවුන් අනුභවයට සූදානම්ව සිටින බැවින් බේරී පැන යාමට හැකි ජිවියෙක් නිරතුරුව බිහිවේ. මොවුන්ගේ නෙත් උපතේදීම විවරව ඇත. බොහෝ විට බිත්තර ඇසුරෙන් බිහිවන මෙම සතුන් උප්පත්ති ක්‍ෂණයකින් තම ජිවිතය ආරක්‍ෂාකර ගැනීම සඳහා පැනයා හැකි සතුන් වේ. මෙම සතුන් බිජුවල ගත කරන අවසන් කාලය තුළදී සක්‍රීය ජිවීන් ලෙසම එම බිජුවලින් එළියට පැමිණෙති.

කූඩු ලෙස හඳුන්වන්නේ පාදමක් නොමැතිව බිත්තියෙන් පමණක් ආවරණය වූ වාසස්ථාන වේ. බොහෝ විට ගසක මුදුනක කෝටු කැලි කිහිපයක් එකතුකර සාදාගත් හෝ පත්‍ර කිහිපයක් එකතුකර සාදාගත් හෝ වඩු කුරුල්ලන් භාවිතා කරන නිර්මාණශීලි කූඩු මේ ගණයට අයත් වේ. බිත්තරවලින් බිහිවන බොහෝ සතුන් කූඩු නිවහන කරගෙන සිටිති. මොවුන්ගෙන් බොහෝමයක් පක්ෂීන් වේ. මොවුන්ද දෙමාපියන්ගේ අධීක්‍ෂණය යටතේ පරිසරයට හුරුපුරුදු වී ඉන්පසු තම ජිවන ගමන ගෙනයාම සඳහා මව් සතුන් විසින් මුදාහරිනු ලබයි. ඉන්පසු ඔවුන් නෑදෑ සම්බන්ධතා නොපවත්වයි. නොහඳුනයි. මොවුන් ආහාරය සඳහා ද මෛතුන්‍ය සේවනය සඳහා ද ජිවත් වේ. මොවුන්ද ජනිත වී කෙටි කාලයක්, ඇස් විවරවීමට ගත වේ. මුල් අවධියේදී මස් ගුලියක ස්වභාවයක් දරනු ලබන සතුන් වේ. මාපිය පෝෂණය යටතේ පෝෂණය වී උස් මහත් වන සතුන් වේ. තවත් කූඩු විශේෂයක් ඇත. ඒ මිනිසුන් හා සතුන් සිර කරනු ලබන කූඩුය.

නිවාස වශයෙන් තවාතැන් පොලවල් බොහෝ විට භාවිත කරනුයේ ගවයන්, අලි ඇතුන් වැනි සතුන්ය. ඔවුන්ගේ නිවාස ස්ථිර ලැගුම් පොලවල් වේ. මෙම නිවාස විශේෂයට පාදමක් විතරක් උරුම වී ඇත. මෙම සතුන් පරිසරයේ කිසියම් විශේෂ වූ භූමියක ඔවුන්ගේ තවාතැන් පල තෝරා සනිටුහන් කර ගෙන ඇත. ආහාර හා ජලය සපයා ගැනීම සඳහා බැහැරට ගොස් නැවතත් ඉර අවරට යද්දී තවාතැන් කරා ගමන් කරති. මෙම සතුන්ගේ සුවිශේෂත්වය වන්නේ ඉපදෙන විටම ඇස් වල පෙනුම ලැබී ඇති අතර, ඉන්දි සුළු මොහොතකින් දුව පැන ඇවිදීමට හැකියාව උපතින්ම ලැබී ඇත. මෙම සතුන් බොහෝ විට ශාක භක්ෂකයෝයි.

පොදුවේ නිවසක් ලෙස භාවිත කර අංගසම්පූර්ණ නොවූ නිවහනක් ඇති සියළුම සතුන්ගේ පොදු ලක්ෂණය වනුයේ ඔවුන් ඉන්දි කිසියම් කාලසීමාවක් තම මව්පියන්ගේ උපකාරයෙන් ජිවිතය ජිවත්කොට පරිසරයට අනුගත වන බවයි. මොවුන්ගේ ඇස් විවරවීමට කිසියම් කලක් ගත වන අතර එම කාලසීමාව තුළදී සුරක්ෂිතභාවයක් අවශ්‍ය වුවහොත් එම සත්වයාගේ මව් සතුන් විසින් ඔවුන් කටින් අල්ලාගෙන හෝ තැනකින් තැනකට ගෙනයනු ලබයි. මොවුනට නෑදෑ සබඳතා නැත. අංග සම්පූර්ණ නිවසක ජිවත් නොවන්නෝ තිරිසන් සතුන් වේ. ඔවුන් පොළොවට සමාන්තරව තිරස්ව ගමන් කරයි.

අංග 03 කින් සමන්විත පූර්ණ වූ නිවාසවල ජිවත් වන්නෝ මනුෂ්‍යයෝ වෙති ඔවුන්ගේ උපතේදීම ඇස් විවරව ඇත. ප්‍රධාන අංගයන් 03 කින් සම්පූර්ණ වූ නිවසක් කවදා කොතැනකදී හෝ මිනිසුන්ගේ පූර්ණ පරිණාමයේදී නිර්මාණය කොට ගෙන ඇත. මේවාට සිංහල භාෂාවේ යෙදී ඇති වචන වලද අපූර්වත්වයක් දරයි. එනම්, ප්‍රියයන් ඇසුරට හමුවූ තැන පියැස්ස නම් වේ. එළියට වූ පැත්ත එළිපත්තද ගෙය පලදුන් තැන ගෙපල වසාගෙන ආලය කළ ආවරණය වහලයද වේ.

කෙසේ වෙතත් ජ්‍යොතිශ වාස්තුව මිනිසාගේ නිවාස නිර්මාණයේ අදෘශ්‍යමාන හස්තය වේ. එය වාස්තු විද්‍යාවේ මූල බීජය වී ඇත. දිසාව චුම්භක ක්ෂේත්‍රය ජල ධාරාව සුළං දිසාව වස්තු ලැබීමේ ප්‍රවනතාවය නිරෝගිමත් කම හා විශ්ව ශක්තියේ බලපෑම ජ්‍යොතිශ්‍ය විසින් ගණනය කොට අගය කිරීමට ලක් කර ඇත. මානවයා පිරිපුන් නිවාසයක් නිර්මාණයේදී සොබාදහමේ ආශිර්වාදය අත්‍යාවශ්‍ය බව වාස්තු ජ්‍යොතිශ්‍යයෙන් තහවුරු කර ඇත.

නිවසක ජිවත් වන්නන්ගේ චර්යාව එම නිවසේ හැඩය, නිර්මාණය ගොඩනගා ඇති ස්ථානය අනුව තීරණය වේ. කිසියම් නිවසක් වෙත විමර්ෂණශීලි නෙත් යොමු කරන්නෙකුට එම නිවසේ ජිවත් වන්නන් කෙතරම් පොහොසත්ද, නිර්මාණශීලිද, ගුණයහපත්ද, සමාජ වැඩදායී පුද්ගලයින්ද යන්න පිලිබිඹු වේ. මෙයින් අදහස් කරනුයේ නිවසේ ජිවත් වන්නන්ගේ ආර්ථික පොහොසත්කම නොවේ. නිවසේ වෙසෙන්නන්ගේ ගුණාත්මක බවේ පොහොසත්කමය. එම නිවස සමග නිවසේ ගෙළයන් නිර්මාණය වේ. ඒ අනුව නිවසේ ජිවත් වන්නන් ගහට කොළට සතුන් සිවුපාවුන්ට පිරිනමා ඇති ආදරය කරුණාව හඳුනාගත හැකිය. අංග තුනකින් සම්පූර්ණ නොවූ නිවසක් තුළ හැදෙන වැඩෙන සත්වයින් ඒ ඒ පරිසරයන්ට අනුව නිර්මාණය වී ඇති ආකාරය විශ්මය ජනක නොවේද.

මෙම ලිපිය තම තම නැණ පමණින් දැනීමට සෙවීමට ඉති පොත්තක් කරලීම මගේ පැතුම වේ.

**ලුතිනන් කර්නල් එස්පී කහවේවිතාන - ගැහේබ**

*ශාස්ත්‍රවේදී සමාජ විද්‍යා (කැළණිය) පශ්චාත් උපාධි ඩිප්ලෝමා උපදේශනය (කොළඹ) මානව සම්පත් කළමනාකරන උසස් ජාතික ඩිප්ලෝමාව (ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය)*





# නිවාස සිහිනය සැබෑ වූ වගයි...

යුද්ධ හමුදාධිපති තුමන්ගේ සංකල්පයක් මත ක්‍රියාත්මක පූර්ණ නිවාස ව්‍යාපෘතිය යටතේ ඉදිකරන ලද නව නිවසක් වෛද්‍ය වර්ගකිරීම් කරන ලද ඉංජිනේරු සේවා රෙජිමේන්තුවට අයත් සෙ/8එස්00489 ලා/කෝ සමරවික්‍රම එස්ඩීසී වෙත භාරදීම ඉකුත් පෙබරවාරි 19 වන දින සිදුකෙරිණ. කර්නල් ජීඩීඑච්කේ විජේනායක ගේ ප්‍රධානත්වයෙන් පැවති එම අවස්ථාව සඳහා ඉංජිනේරු සේවා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ නිලධාරීන්, සෙසුනිලයින් පිරිසක් සහභාගී වූහ.

# අභිමන් සේවයට බුහුමන්....



යුද්ධ හමුදාධිපතිතුමාගේ සංකල්පයක් මත ක්‍රියාත්මක පූර්ණ නිවාස ව්‍යාපෘතිය පස්වන අධියර යටතේ ඉදිකරන ලද නව නිවසක් 1 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බලකායට අයත් සෙ/701411 කෝප්‍රල් ජයවර්ධන ටීකේ වෙත භාරදීම ඉකුත් ජනවාරි 29 වන දින 1 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බලකායේ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් සීඑස් දේමුණි ශ්‍රීලයුපොදුසේබ ගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණ.

ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බලකායේ බලකාධිපති ගේ මාර්ගෝපදේශකත්වය මත මධ්‍යස්ථාන සේනාවිධායක ගේ පූර්ණ අධීක්ෂණයෙන් යුතුව ඉදිවූ එම නිවසට 1 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බලකායේ සෙබළුන්ගේ ශ්‍රමදායකත්වය හිමිවූහ.

# දිලිඳු පවුලක් වෙත නව නිවසක්...





9 වන බලඇණිය විජයබාහු පාබල රෙජිමේන්තුවේ නිලධාරීන් සහ සෙසුනිලයින්ගේ ශ්‍රම දායකත්වයෙන් සෙ/529490 සාසෙ විමලසිරි බීජීසී යන එම ඒකක සෙනියාගේ ලගම ඥාතියා වන ඊජී ජිවනි අනුරුද්ධිකා මහත්මිය වෙත නව නිවසක් ඉදිකර භාරදීම ඉකුත් පෙබරවාරි 10 වන දින සිදුකෙරිණ. යුද්ධ හමුදාධිපතිතුමන්ගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පූර්ණ නිවාස ව්‍යාපෘතිය 5 වන අධියර යටතේ ලබාදෙන මූල්‍ය ප්‍රතිපාදන වැයකොට ඉදිකර මෙම නිවස එහි අයිතිකරු වෙත භාරදීම විජයබාහු පාබල රෙජිමේන්තුවේ මානි 1 (රණසේවා) ලුතිනන් කර්නල් එම්ජේඩීබී උඩපමුණුව ආර්ඩබලිව්පී ආර්එස්පී යූඑස්පී විපාරෙ ගේ සුරතින් සිදුවිය.

# නිවාස සිහිනය සැබෑ කරමින්...





21 වන පාබල සේනාංකයට අයත් 212 වන පාබල බලසේනා බලප්‍රදේශයේ හි මැදවච්චිය, තන්තිරිමලේ යන ලිපිනයේ  පදිංචි පී සේපාලිකා පියදාස මහත්මිය හට නව නිවසක් ඉදිකරදීම සඳහා මුල්ගල තැබීමේ උත්සවය පසුගියදා 212 වන බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් පීඒඑම් පීරිස් ආර්එස්පී යූඑස්පී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් සිදුකරන ලදී.

ඔස්ට්‍රේලියාවේ පදිංචි ශ්‍රී ලාංකික ධානපතියෙකු වූ සන්ධිය නානායක්කාර මහතාගේ පුද්ගලික ධන පරිත්‍යාගයෙන් 212 වන පාබල බලසේනාවේ අධීක්ෂණය යටතේ 5 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ හටපිරිස්හි ශ්‍රම දායකත්වයෙන් මෙම නිවසේ ඉදිකිරීම් සිදුකරනු ලබයි.

# නිරෝගීමත් ජාතියක් රටකට වාසනාවක්



බත්තරමුල්ල සිට යුද්ධ හමුදා මූලස්ථානය දක්වා දිවෙන මාර්ගය දෙපස ඇති මනරම් පරිසරය නිසාම විශේෂයෙන්ම උදේ සමය ඉතා සිත් ඇද ගන්නා දසුනකි. ක්‍රීඩා ඇඳුමින් සහ සාමාන්‍ය ඇඳුමින් සැරසුණු තරුණ, බාල, මහළු සියලුම අය තම ශරීර සෞඛ්‍ය මනාව පවත්වාගෙන යාම සඳහා වරෙක ඇවිදිමින් වරෙක දුවමින් යන අයුරු කාගේත් නෙතට යොමු වෙයි. විවිධ වර්ගයේ ඖෂධීය, දේශීය ශාකවල නැවුම් පහස විඳිමින් සහ ඒවායින් සෙවන ලබමින් ව්‍යායාමවල යෙදෙන මෙම පිරිස සිය මිතුරන්, දරුවන් හා ඥාතීන් සමග තනි තනිව හා කණ්ඩායම් ලෙස නිදහස් තැන්හි හිඳිනු දැකීම සතුටකි.

මෑත අතීතයේ පුරන්ව තිබූ කුඹුරු යාය මෙන්ම මඩ ගොහොරුවක්ව පැවති ඇල දොළ, මදුරුවන්ගේ සහ සර්පයින්ගේ තෝතැන්නක් වූ භූමි ප්‍රදේශය අද වගාකරන ලද නිල් ගොයමින් හා නිල් පැහැති ජලයෙන් පිරුණු පොකුණුවලින් හෙබි මනරම් උද්‍යානයක් බවට පත්වී හමාරය. කුඹුරු යාය කෙලවරින් ඇති ඇවිදින මංතීරුවේ ව්‍යායාමවල යෙදෙන්නන් හට මානසික සුවයෙන් කාලය ගත කිරීමට මනා පිටුවහලක් වී ඇත. වෘත්තීමය දැනුමැති යුද්ධ හමුදා ප්‍රවීණයින්ගේ සැලසුම්වලට අනුව "කල නොහැක්කක් නොමැත" යන අධිෂ්ඨානශීලී පාඨය පෙරදැරිකරගෙන සිය හමුදා නායකයාගේ ශ්‍රේෂ්ඨ සංකල්පයකින් ආරම්භ වූ "තුරු මිතුරු නව රටක්" වැඩසටහන සහ රාජ්‍ය නායකයාගේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයට පිටුවහලක් වෙමින් යුද්ධ හමුදා සාමාජිකයින්ගේ දැඩි කැපකිරීම මත ආරම්භ විය. මේ මහා කාර්යභාරයේ ඵල නෙලා ගනුයේ අන් කිසිවෙක් නොව පොදු මහ ජනතාවයි.

"තුරු මිතුරු නව රටක්" වැඩසටහන අධියර කිහිපයකින් ආරම්භ විය. ප්‍රථමයෙන්ම යුද්ධ හමුදා මධ්‍යස්ථානයට දිවයන මාර්ගය දෙපස පැල රෝපණය කරන ලද අතර, ඊට සමගාමීව අතහැර දමා තිබූ අක්කර 1.2 ක පමණ කුඹුරු වී වගා කටයුතු සඳහා පිළියෙල කරන ලදී. ඊළඟ පියවර වූයේ කිලෝමීටර් 2.6 ක දිගකින් යුත් ඇවිදින මංතීරුවක් කුඹුර වටා ඉදිකිරීමයි. මනාව සංවිධානය කරන ලද යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ සැලසුමකට අනුව සියලු කටයුතු පියවරෙන් පියවරට සිදුකෙරිණ.

ශ්‍රී ලංකාවේ ප්‍රථමයෙන් ඉදිකරන ලද ළමා උද්‍යානයක් සහිත විවෘත ක්‍රීඩාගාරය, සියලුම ක්‍රීඩා උපකරණ එළිමහනේ සවිකර මහජනයා වෙත දායක කර ඇත. සෑම වයස් කාණ්ඩයකටම අයත් ක්‍රීඩා ලෝලීන්ට මෙම නවීන පහසුකම් සියල්ල උපදේශකයින් සමග නොමිලේ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව මගින් සපයනු ලබයි. මෙම පහසුකම් කලාප තුනකින් සමන්විත වෙයි.





රජයේ ප්‍රතිපත්තියක් වන පරිසර හිතකාමී හරිත නගර, හරිත මංමාවත් මෙන්ම හරිත සෙවණක් සඳහා වූ උදාර සංකල්පයකට පිටුවහලක් වෙමින් ඒ උදාර කාර්යයට උරදීමට ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සැමවිටම කැපවී සිටී.

මෙවන් පරිසරයක හදවතේ උතුරා යන සතුටකින් මෙම පහසුකම් භුක්ති විඳින සුවහසක් ක්‍රීඩා ලෝලීන් අතරින් කිහිප දෙනෙකු ඒ සිය සතුට මෙසේ ප්‍රකාශ කරයි. ඇවිදීමේ මංතීරුවට පැමිණි කාන්තා ගුරුවරියක වූ ඇය ලබන පහසුකම් පිළිබඳව අදහස් දක්වමින්.

"මම මීරා චාන්. මම ඉන්නෙ කොල්ලුපිටියෙ. අද මම මගෙ අක්කගෙ ගෙදර ආව. ඇත්තමට මට හිතාගන්නවත් බැහැ මෙතන තියෙන පරිසරයයි පහසුකමුයි අපිට තියෙන ආරක්ෂාවයි ගැන. යුද්ධ හමුදාව කරන මේ සේවාව අතිවිශිෂ්ඨයි. අවංකවම මේ කරන සේවයට මම යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතාට අනේකවාරයක් ස්තුතිවන්ත වෙනව".

තවදුරටත් අදහස් දක්වමින් ඇය ප්‍රකාශ කලේ "ඇත්තටම ඔහු නිසා අපි ලොකෙ සිදුවන දේවල්වලින් යාවත්කාලීන වෙනව. ලෝකෙ අනෙක් රටවල් එක්ක බැලුවොත් කොවිඩ් 19 ඉතා සාර්ථකව පාලනය කරන්නත් පුළුවන් වෙලා තියෙන්නෙ ඒ නිසයි" යැයි පැවසීය.



**"ශ්‍රී ලංකාවේ ප්‍රථමයෙන් ඉදිකරන ලද ළමා උද්‍යානයක් සහිත විවෘත ක්‍රීඩාගාරය, මෙය වන අතර එහි සියලුම ක්‍රීඩා උපකරණ එළිමහනේ සවිකර මහජනයාගේ පරිහරණයට වෙන්කර තිබීම විශේෂත්වයකි."**



"මම රජයේ දෙපාර්තමේන්තුවක විධායක නිලධාරියෙක්. මගේ රාජකාරි කටයුතු සමග මම ඉතා කාර්යබහුල පුද්ගලයෙක්. මට ඇත්තටම මේක හීනයක්. මේ මංතීරුව, අවට පරිසරය, ශාරීරික අභ්‍යාස උපදේශකවරු මේ හැම දෙයක්ම කොළඹ ප්‍රදේශයේ මේ ආකාරයෙන් නොමිලේ ලැබීම මටනම් හීනයක්. මම ඉතාමත් ගෞරවයෙන් හා භක්තියකින් මගේ ප්‍රශංසාව ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතාට මේ අවස්ථාවේ පුද කරනව" යැයි පැවසීය.

තව දුරටත් අදහස් දක්වමින් ඔහු ප්‍රකාශ කළේ "මම ලංකාවේ බොහොම තැන්වල යනව. මම සංචාරය කිරීමට හරි කැමතියි. මම ලංකාවේ බොහොමයක්ම ඇවිදින මංතීරු දැකල තියෙනව. නමුත් ඒ සියල්ලටම වඩා ඉතාමත්ම උසස් ලෙස අලංකාරවත් ලෙස, ඒ වගේම සියලුම පහසුකම් සහිත නිදහසේ භුක්ති විඳිය හැකි ස්ථානයක් තමා මේක. මම ස්තුතිවන්ත වෙනව නිරෝගීමත් ජාතියක් ගොඩනගා ගැනීම සඳහා රජය ගෙනයන වැඩසටහනට යුද්ධ හමුදාධිපති තුමාගේ උදාර දායකත්වය වෙනුවෙන්".

මානසික ශාරීරික සෞඛ්‍ය යහපත් ඵලදායි ජීවිතයක් ගත කිරීම ඉතාමත් අවශ්‍ය දෙයක් වන අතර, නිරෝගී මනසක් පුද්ගලයෙකුට සතුට, සැනසුම සහ තෘප්තිය ලඟාකර දෙයි. වර්තමාන සමාජය මෙම කරුණු පිළිබඳව අවධානය යොමු කිරීම සතුටට කරුණකි. සෑම විටම නිරෝගී ජාතියක් රටකට වාසනාවකි. ආශිර්වාදයකි. එය සංවර්ධනයට ද ඉවහල් වේ. මෙම කරුණු මැනවින් වටහාගත් ශ්‍රී ලංකා රජය ඒ සඳහා යටිතල පහසුකම් බොහොමයක් ජනතාව වෙනුවෙන් ලබාදී ඇත. නවීන පහසුකම් සහිත ඇවිදීමේ මංතීරු, ක්‍රීඩාගාර, ක්‍රීඩා උපකරණ මෙන්ම ශාරීරික අභ්‍යාස උපදේශකවරුන් මේ සඳහා යොදවා ඇත. වියදම් ගැන නොසිතා ජනතාව වෙනුවෙන් ගන්නා ලද අව්‍යාජ ප්‍රයත්නයක් බව සැමොම දන්නා කරුණකි. මෙමගින් ජනතා අපේක්ෂා මුදුන්පත් කරමින් සංවර්ධනය වෙමින් පවතින රටක් වශයෙන් දැනටමත් එළිපත්තට පැමිණ සිටින ශ්‍රී ලංකා නොබෝ දිනකින් "දකුණු ආසියාවේ මුතු ඇටය" බවට නැවතත් පසක්කර ගනු ඇත. මෙම කර්තව්‍යයේ දී ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සිය නායකත්වයේ මඟපෙන්වීම යටතේ රජයට ඉමහත් වූ ශක්තියක් ලබාදෙමින් සිටී.

හමුදා නායකත්වයේ "කළ නොහැක්කක් නොමැත" යන ආදර්ශ පාඨය මත පිහිටා ක්‍රියා කිරීමෙන් ලැබුණු ප්‍රතිඵලයක් ලෙස නිසරු හා වගුරු බිම් සුන්දර පොකුණු සහිත ගොවි බිමක් බවට පත්වී තිබීම ආශ්චර්යයකි. ජනතාවගේ අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා නවීන පහසුකම් සහිත නාගරික හා අර්ධ නාගරික ප්‍රදේශ අංලකාර කිරීම, සංවර්ධනය කිරීම සඳහා වූ රාජ්‍ය ප්‍රතිපත්තිය ශක්තිමත් කරමින් එය සාර්ථක කර ගැනීම වස් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සිය "හුරු මිතුරු නව රටක්" වැඩසටහන මුළු දිවයිනම ආවරණය කරමින් දැනට යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ගේ අධීක්ෂණය හා මගපෙන්වීම යටතේ ක්‍රියාත්මක වෙයි.

බත්තරමුල්ල ප්‍රදේශයේ තවත් පුද්ගලයෙකු සිය අදහස් ප්‍රකාශ කරමින් මෙසේ පැවසීය.

**ලුතිනන් කර්නල් ඩබ්ලිව්ඩබ්ලිව් අභයපත්තු - ජාතික ජනමාධ්‍ය අංශ**



යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් සහ යුද්ධ හමුදා යුධෝපකරණ බලකා කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් සීයූ මාරසිංහ ආර්එස්පී යූඑස්පී පසුගියදා 3 වන යුද්ධ හමුදා යුධෝපකරණ බලකායේ සංචාරයක නිරතවිය. එහිදී එම ඒකකය තුළ අභිනවයෙන් ඉදිකරන ලද සුගලා කාන්තා හට නිවාසය, ඒකක රෙදිපිළි උප ගබඩාව සහ සරඹ පීඨිකාව සුභ මොහොතින් සෙබල අයිතියට පැවරීමද ඔහුගේ අතින් සිදුවිය.



එම අවස්ථාව සඳහා 3 වන යුද්ධ හමුදා යුධෝපකරණ බලකායේ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් ඩබ්ලිව්එස්ඩී ප්‍රනාන්දු ඒටීඕ එල්එස්සී ශ්‍රීලයුයුබ ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයින් රැසක් සහභාගි වූහ.

# සංචාරයක සටහන්...



පුනරුත්ථාපන අධ්‍යක්ෂක ජෙනරාල් මේජර් ජෙනරාල් ඩබ්ලිව්බීඑස්එම් අබේසේකර ආර්එස්පී යූඑස්පී සහ පුනරුත්ථාපන අධ්‍යක්ෂක බ්‍රිගේඩියර් පීඩීජී සේනාධීර යූඑස්පී ඉකුත් පෙබරවාරි 17 වන දින රණවිරු සෙවන යටතේ ක්‍රියාත්මක වන ගාල්ලෙහි පිහිටි සෘජුකාරක හා අංගාදේශක විකලාංග කාර්මිකාගාරයේ නිරීක්ෂණ සංචාරයක නිරත වූහ.



එහිදී රණක්ෂිතයට පත් විරුවන්ගේ පුනරුත්ථාපන ක්‍රියාවලිය සඳහා සෘජු දායකත්වයක් දක්වන මෙම කාර්මිකාගාරයෙහි යටිතල පහසුකම් සංවර්ධනය පිළිබඳව පුනරුත්ථාපන අධ්‍යක්ෂ ජෙනරාල් ගේ විශේෂ අවධානය යොමුවිය.

මෙම අවස්ථාවට එම කාර්මිකාගාරයේ සේනාවිධායක කර්නල් පීජීආර් මාදුගොඩ යූඑස්පී ඇතුළු නිලධාරීන් රැසක් සහභාගි වූහ.





# සංවත්සර දින සමරා...

11 වන පාබල සේනාංක මූලස්ථානයේ 11 වන සංවත්සරය ඉකුත් පෙබරවාරි 15 වන දිනට යෙදී තිබුණි. ඊට සමගාමීව එම සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එස්එම්එස්පීබී සමරකෝන් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ ප්‍රධානත්වයෙන් වැඩසටහන් රැසක් පැවැත්විණ. එහිදී කඳවුරු සම්මාන මුරයක් පිරිනැමීම, ශ්‍රී දළදා මාලිගාවේ කිරි ආහාර පූජාව, පාසල් උපකරණ බෙදාදීම, සියළු නිල තේපැන් සංග්‍රහය හා ප්‍රධාන මුළුතැන්ගෙය සඳහා මුල්ගල තැබීම සංවත්සර වැඩසටහන් අතර කැපීපෙනුණි.






# පරිත්‍යාගයක්...

පොළොන්නරුව මඩුදමන ආදර්ශ ප්‍රාථමික විදුහලට දීර්ඝකාලීනව පැවති අඩුපාඩුවක් පසුගියදා සම්පූර්ණ කෙරිණ. ඒ අනුව එම විද්‍යාලයට අවශ්‍යව තිබූ ඡායා පිටපත් යන්ත්‍රයක්, පරිගණකයක් ඇතුළු පාසල් උපකරණ සහ ක්‍රීඩා භාණ්ඩ තොගයක් ඉකුත් පෙබරවාරි 20 වන දින පරිත්‍යාග ලෙස හිමිවිය. එහි විදුහල්පති විසින් 2 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකායේ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් ආර් විතානආරච්චි යූඑස්පී ශ්‍රීලයුපොහේබ වෙතින් කරන ලද ඉල්ලීමකට අනුව සිදුකෙරුණු මෙම පරිත්‍යාගයට සිහස් පදනමේ නිර්මාතෘ සහ සභාපති සාලින්ද නිරෝෂන් විජේසිංහ මහතා විසින් අනුග්‍රාහකත්වය ලබාදෙන ලදී. මෙම අවස්ථාව සඳහා ගුරුභවතුන්, ශිෂ්‍ය ශිෂ්‍යාවන් සහ දෙමාපියන් රැසක් ද සහභාගී වූහ.







# කොරෝනා මැඩලීමට මුල්වෙමින්...

රටෙහි පවතින කොවිඩ් 19 වෛරස් ව්‍යාප්තිය වැළැක්වීමේ පියවරක් ලෙස 68 වන පාබල සේනාංක බලප්‍රදේශයේ ඇති 18 විපාරෙ ඒකකය විසින් තේව්පුරම් ප්‍රදේශය ආවරණය වන පරිදි කොවිඩ් 19 වෛරසය වළක්වා ගැනීම සබැඳි අත්පත්‍රිකා බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් ජනවාරි 26 වන දින දියත් කරන ලදී.

# තුරුලිය රැකුමට උරදෙමින්...





65 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩීඑම්ටී දිසානායක ආර්එස්පී යූඑස්පී ගේ උපදෙස් පරිදි එම සේනාංක ප්‍රදේශය තුළ අක්කර 2 ක පමණ භූමි ප්‍රදේශයක පැළ රෝපණය කිරීමේ වැඩසටහනක් ඉකුත් පෙබරවාරි මස 04 වන දින සිදුකරන ලදී. ඒ අනුව 651, 652 හා 653 වන පාබල බලසේනා බලප්‍රදේශයන් හි පොල්පැල 325 ක්, කොස් පැල 110 ක් හා මීපැල 200 ක් රෝපනය කිරීම සිදුකරන ලදී. මෙම අවස්ථාව සඳහා 65 වන පාබල සේනාංකයේ හා පාබල බලසේනාවන්හි රාජකාරි කරනු ලබන නිලධාරීන්, සෙසුනිලයින් රැසක් සහභාගි වූහ.





61 වන පාබල සේනාංක මූලස්ථානය තුල දැනට වගාකර ඇති පොල් ගස් වසර 40 ක් පමණ පැරණි වීම හා ඒවායේ ඵලදාව අඩුවීම හේතුවෙන් ඒවා වෙනුවට කැවුරු පරිශ්‍රයේ වසර 05 කින් ඵලදාව ලබාගත හැකි දෙමුහුන් "ග්ලස් ෆාම් 05" පොල් ප්‍රභේදයේ පැල 100 ක් රෝපණය කිරීමේ ව්‍යාපෘතියේ ආරම්භය ඉකුත් පෙබරවාරි 22 වන දින ඇරඹිණ. 61 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ධම්මි හේවගේ ආර්එස්පී ගේ සංකල්පයකට අනුව පොල් සංවර්ධන මණ්ඩලය හා එක්ව සිදුකළ මෙම කටයුත්ත ලුතිනන් කර්නල් එච්ජීඑම් නිශාන්ත ආර්එස්පී විසින් සම්බන්ධීකරණය කරන ලදී.





# ඉගෙනුමට අත්වැලක්...

12 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ආර්ඒඩීපී රණවක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී ගේ සංකල්පයක් මත එම සේනාංක බලප්‍රදේශයේ තෝරාගන්නා ලද අඩුආදායම්ලාභී පවුල්වල පාසල් සිසු සිසුවියන් සඳහා පාසල් උපකරණ පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් ඉකුත් පෙබරවාරි 20 වන දින පවත්වන ලදී. තවද එම උත්සවය සඳහා සහභාගී වූ සියලුම දරුවන් සහ දෙමාපියන් වෙනුවෙන් තේපැන් සංග්‍රහයක්ද පවත්වන ලදී. *V S INFROMATION SYSTEMS (PVT) LTD* ආයතනයේ සොනාලි මහත්මිය ඇතුළු මහත්ම මහත්මීන් එම පාසල් උපකරණ සඳහා අනුග්‍රාහකත්වය ලබාදෙන ලදී.





# පරිගණක පාඨමාලාවක්...

64 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එම්පී කරුණාරත්න අයිජී ගේ උපදෙස් හා මඟපෙන්වීම යටතේ යුද්ධ හමුදා සහ සිවිල් ජනතාව අතර සංහිඳියාව වර්ධනය කිරීමේ අරමුණින් යුතුව එම බලප්‍රදේශයේ සිවිල් තරුණ තරුණියන් හට නොමිලේ මූලික පරිගණක දැනුම ලබාදීමේ අරමුණින් වූ පරිගණක පාඨමාලාවක් 64 පාබල සේනාංක මූලස්ථාන විද්‍යාගාරයේදී ඇරඹිණ. එම සේනාංකයේ කර්නල් ප්‍රමානි කර්නල් ජීපීපී කුලතිලක ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් පෙබරවාරි 22 වන දින ඇරඹි මෙම පාඨමාලාව අප්‍රේල් 02 වන දින දක්වා පැවත්වීමට නියමිතව ඇත.





# අධිෂ්ඨානයෙන් අභීතව අරමුණ කරා...

## විශේෂ බලකා රෙජිමේන්තු ස්මාරකය...

ස්වකීය ජන්ම භූමිය දිවි හිමියෙන් සුරැකීමේ උදාර අරමුණ පෙරදැරි කරගනිමින් රුදුරු සතුරාට එරෙහිව සටන්කොට වික්‍රමාන්විත ලෙස රට වෙනුවෙන් දිවි පුදකල විශේෂ බලකා විරුවන් අභිමානයෙන් සිහි කිරීම සඳහා විශේෂ බලකා රණවිරු ස්මාරකය ගොඩනංවා ඇත.

මෙම ස්මාරකයේ සන්නද්ධ සොල්දාදුවන් හතර දෙනාගෙ න් මූර්තිමත් කරනුයේ විශේෂ බලකා රෙජිමේන්තුවේ මූලික සංකල්පය වන සිව්දෙනෙකුගෙන් යුත් කණ්ඩායමයි. සියළු බාධක බිඳහෙලා සතුරු භූමිය විනිවිද යාමේ විශිෂ්ඨ හැකියාව මෙන්ම ඔවුන්වම ආවේනික වූ කාරුණ්‍යගුරුත්වය එඩිතරභාවය හා ප්‍රෞඩ නායකත්වය ඔවුන්ගේ මුහුණු වල ඉරියව් මගින් මනා ලෙස බිළිඹිබු කරයි.

සංග්‍රාම භූමියෙහි පවතින රුදුරු බව මෙන්ම අනතුරුදායක භාවය තුවාලලත් සෙබලාගේ මූර්තිය මගින් එළිදක්වාලයි. සතුරු එඩි සිඳ දැමීමට ඇති සංග්‍රාමික නිපුනතාවය තමන් සතු ප්‍රබල වෙඩි බලය මෙන්ම නොසිඳෙන යදම්සේ ශක්තිමත් වූ අන්‍යෝන්‍ය සහයෝගය හා එකමුතු භාවය තුවාලලත් සහෝදර සෙබලා නිරුපද්‍රිතව රැගෙන එන ආකාරය තුළින් විදහා දක්වයි.

"අධිෂ්ඨානයෙන් අභීතව තම අරමුණ කරා" පිය නගන නිර්භීත විශේෂ බලකා විරුවන් සෑම සටනකදීම සතුරු බලමුළු සුනුවිසුනුකොට විජයග්‍රහණයන් ලබාගනිමින් විශේෂ බලකායේ කීර්තියත් අභිමානයත් නිබඳවම සුරකින බව එම ධජය ඔසවා ලෙළ දෙවමින් සිටින ආකාරය මගින් ප්‍රකාශිත කරනු ලබන්නේය.

රණශූරත්වයේ සංකේතයක් වූ මෙම අභිමානවත් රණවිරු ස්මාරකය තුළින් ඔවුන්ගේ නාමයන් සදානුස්මරණියව අප හදවත් තුළ ජීවමාන වනු ඇත. එය ඔවුන් මව් බිම වෙනුවෙන් හෙළූ දහඩිය කඳුළු හා රුධිරය ගැන මතු පරපුරට කියැවෙන ජීවමාන වෘත්තාන්තයක් වනු ඇත. සියළු දේශප්‍රේමී ලක් වැසියන්ගේ මෙන්ම අනාගත පරපුරටද වන්දනීය වූ පූජනීය වූ ඓතිහාසික අගනා වස්තුවක් ලෙස ප්‍රතාපවත් අයුරින් මෙම රණවිරු ස්මාරකය චිරාත් කාලයක් දෙස් විදෙස් ජනී ජනයාගේ ගෞරව බහුමානයට ලක්ව පවතිනු ඇත.

මෙම රණවිරු ස්මාරකය එවකට 1 වන රෙජිමේන්තුව විශේෂ බලකායේ අණදෙන නිලධාරී මේජර් සීපීඑස් වඩුගේ ගේ අධීක්ෂණයෙන් ඉදිකල අතර එවකට විශේෂ බලකා රෙජිමේන්තු අධිපති බ්‍රිගේඩියර් ජී හෙට්ටිආරච්චි ගේ ආරාධනයෙන් දිවංගත මේජර් ජෙනරාල් ඩෙන්සිල් කොබ්බෑකඩුව සෙන්පතියාණන්ගේ ආදරණිය බිරිඳ වූ ලිලී කොබ්බෑකඩුව මැතිණිය විසින් වර්ෂ 2001 වූ ජනවාරි මස 20 වන දින විවෘත කර ඇත.

*ඉදිරිපත් කිරීම*
*රෙජිමේන්තු මධ්‍යස්ථානය*
*විශේෂ බලකාය*





# හිසට සෙවනක්...

වන්නි ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ඩීඑම්එච්ඩී බංඩාර ආර්ඩබ්ලිව්වී ආර්එස්පී යූඑස්පී ගේ උපදෙස් මත 56 වන පාබල සේනාංකයේ අධීක්ෂණයෙන් අඩුආදායම්ලාභී දිළිඳු පවුලක් වෙනුවෙන් ඉදිකෙරෙන නව නිවසක් සඳහා ඉකුත් පෙබරවාරි 17 වන දිනමුල්ගල තැබිණ.

මෙම මාහැඟි කටයුත්තට කොළඹ ඔපෝ මොබයිල් පුද්ගලික ආයතනයේ අධ්‍යක්ෂක සහ එහි කාර්ය මණ්ඩලය විසින් ධන පරිත්‍යාග කරන ලද අතර, 7 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ භටපිරිස් එය ඉදිකිරීම සඳහා ශ්‍රමදායකත්වය සපයනු ලබයි. 56 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඒඒඩීඑන්එස්පී දුණුවිල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් පැවති එම මුල්ගල තැබීමේ අවස්ථාවට 561, 562 වන පාබල සේනාංකයන්හි සේනාංකාධිපතිවරු, අදාළ නිවෙස්ලාභීන් සහ ගම්වැසියන් රැසක් සහභාගී වූහ.





# දැනුවත් කිරීමේ වැඩසටහනක්...

යුද්ධ හමුදාධිපති ගේ උපදෙස් පරිදි ආරක්ෂක සේනා (මධ්‍යම) ආඥාපති ගේ පූර්ණ අධීක්ෂණය මත යුද්ධ හමුදා යහසාධක අරමුදලට අදාලව යුද්ධ හමුදා යහසාධක අධ්‍යක්ෂක මණ්ඩලය වෙතින් සිදුකරනු ලබන කාර්යයන්, ඉන් ලබාගත හැකි සේවාවන් සහ ප්‍රතිලාභ හිමිවන ආකාරය පිළිබඳව දැනුවත් කිරීමේ දේශනයක් ඉකුත් පෙබරවාරි 22 වන දින ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) සෙසුනිල භෝජනාගාර ශාලාවේදී පවත්වන ලදී.

යුද්ධ හමුදා යහසාධක අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් ආර්පීඑස් පද්මශාන්ත විසින් මෙම දේශනය මෙහෙයවූ අතර, ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) යටතේ රාජකාරී නියුතු නිලධාරීන් සහ සෙසුනිලයින් පිරිසක් ඊට සහභාගි වූහ.



# ආපදා තත්වයන්ට මුහුණ දෙමින්...

පසුගිය දිනවල කිලිනොච්චි ප්‍රදේශයට පැවති අයහපත් කාලගුණික තත්වය හේතුවෙන් හදිසියේම ජල කාන්දුවකට ලක්වූ කන්දකුලම් වැව් බැම්ම පැය හයකටත් වඩා අඩු කාලයකදී යථා තත්ත්වයට පත්කිරීමට 7 වන ශ්‍රී ලංකා පාබල හමුදාවේ සහ 9 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ භටපිරිස් කටයුතු කළහ. 571 වන බලසේනාධිපතිගේ අධීක්‍ෂණයෙන් සිදුකළ මෙම කටයුත්ත මගින් වගාබිම් සහ පහත්බිම් විශාල ප්‍රමාණයක් යටවීමට තිබූ අවස්ථාව මගහරවා ගැනීමට හැකිවිය.



# වැව් බැම්ම පිලිසකර කරමින්....


පසුගිය දිනවල පැවති අයහපත් කාලගුණික තත්වය හේතුවෙන් ඉනාමළුව ග්‍රාමයේ "කීනගහ" වැව් බැම්මට දැඩි ලෙස හානි සිදුවිය. ඉන් වැවට පහළ අස්වද්දා ඇති කුඹුරුවලට මෙන්ම ගම්මානයටද විශාල ජල කාන්දුවක් හේතුවෙන් සිදුවන්නට ගිය හානිය වළක්වාලීමට විරෝධාර රණවිරුවෝ සමත් වූහ. එහිදී 53 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එස්යූඑම්එන් මානගේ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ගේ උපදෙස් හා මගපෙන්වීම මත එම සේනාංකයේ සෙබළුන් හා ගම්වාසීන්ගේ සහයෝගීතාවයෙන් අදාල වැව් බැම්ම පිලිසකර කිරීමට කටයුතු කරන ලදී.





# සිප්සතරට දිරියක්...

ආරක්‍ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) බලප්‍රදේශයේ පිහිටි දුෂ්කර ගම්මානයක් වන මීමුරේ ග්‍රාමයෙන් ඉකුත් පෙබරවාරි 14 වන දින "ජනපති ගම සමග පිලිසඳර" වැඩසටහනේ නවත් අධියරක් ආරම්භ විය. එහිදී අතිගරු ජනාධිපති තුමන් විසින් මීමුරේ කයිකාවල කනිෂ්ඨ විද්‍යාලයේ අඩුපාඩුවක්ව පැවති දෙමහල් ගොඩැගිල්ලක් ඉදිකිරීමට හා පාසල් ක්‍රීඩාංගණය අළුත්වැඩියා කිරීමට යුද්ධ හමුදාව වෙත උපදෙස් ලබාදෙන ලදී. ඒ අනුව මධ්‍යම ආරක්‍ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් එච්පීඑන්කේ ජයපතිරණ ආර්එස්පී ගේ උපදෙස් පරිදි අදාල පාසල් ක්‍රීඩාංගණය අළුත්වැඩියා කිරීමේ වැඩකටයුතු ඇරඹි අතර ඊට 6 වන ඉංජිනේරු බලකාය විසින් ශ්‍රම දායකත්වය ලබාදෙන ලදී.







## අභියෝගාත්මක කඳු තරණය කිරීමේ අභ්‍යාසයක්...

53 වන සේනාංක බලප්‍රදේශයේ ස්ථාපිත ඒකක සඳහා ගුවන් සංක්‍රමික පුහුණු පාසල වෙතින් අභියෝගාත්මක කඳු තරණය කිරීමේ අභ්‍යාසයක් අරඹා ඇත. මේ යටතේ වූ පළමු කණ්ඩායම් පුහුණු අභ්‍යාසය ඉකුත් පෙබරවාරි 10 වන දින කිවුලේවාඩිය සිට මීමුරේ දක්වාත්, එහි දෙවන අධියර ඉකුත් පෙබරවාරි 11 වන දින මීමුරේ සිට බඹරැල්ල දක්වාත් කිලෝමීටර් 45 ක දුරක් ආවරණය වන පරිදි නකල්ස් රක්ෂිතයේදී සාර්ථකව පවත්වන ලදී. 53 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එස්යූඑම්එන් මානගේ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ගේ සහභාගීත්වයෙන් පැවති මෙම අභ්‍යාසයට බලසේනාධිපතිවරු ද එක්වූහ.





## සංචාරයක සටහන්....

68 වන සේනාංකයෙහි සේනාංකාධිපති ලෙස වැඩභාරගත් බ්‍රිගේඩියර් කේආර්කේකේටී බංඩාර ආර්එස්පී යූඑස්පී පසුගිය පෙබරවාරි 25,26 දෙදින එම සේනාංකය යටතේ ඇති බලසේනා හා ඒකකවල සංචාරයක නිරත විය. මේ යටතේ 681, 682 බලසේනා මෙන්ම 7 ගැහෙබ, 9 ශ්‍රීලංජාආබමු, 18 විපාරෙ හා 6 ශ්‍රීලංජාආබමු ඔහුගේ නිරීක්ෂණයට බඳුන්විය. මෙම අවස්ථාවට 681 වන බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් ඩීආර්එන් හෙට්ටිආරච්චි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී, 682 වන බලසේනාවේ බලසේනාධිපති කර්නල් එච්සීඑල් ගලප්පත්ති ආර්එස්පී යූඑස්පී ඇතුළු නිලධාරීන් ද එක්වූහ.

වෘත්තීය දිවියේ තවත් කඩඉමක් පසුකොට
සුබ මොහොතින් නව තනතුරු ලැබූ
ඔබ සියලු දෙනාට දිරිය, විරිය, ජයවර්ධනය ලැබේවායි "රණවිරුවා" දී
මෙසේ සුබ පැතුම් එක්කරයි.




ඉදිරි නඩත්තු පෙදෙස (උතුරු මැද)
ආඥාපති ලෙස
බ්‍රිගේඩියර්
එච්එල් ගුරුගේ ඊඊටීඩී
2021 ජනවාරි මස 19 දින සිට



ආරක්ෂක සේනා
මූලස්ථානය(මුලතිව්)
ආඥාපති ලෙස
මේජර් ජෙනරාල්
ආර්පීඩියූ රාජපක්ෂ ආර්ඩබ්ලිව්පී
ආර්එස්පී
2021 පෙබරවාරි මස 22 දින සිට



ආරක්ෂක සේනා මූලස්ථානය
(මුලතිව්) බ්‍රිගේඩියර් ප්‍රධානි ලෙස
බ්‍රිගේඩියර්
එච්පීඑල් ගුණවර්ධන ආර්එස්පී
2021 ජනවාරි මස 16 දින සිට



ආරක්ෂක සේනා මූලස්ථානය
(කිලිනොච්චි) ආඥාපති ලෙස
මේජර් ජෙනරාල්
එච්පී රණසිංහ ආර්ඩබ්ලිව්පී
ආර්එස්පී එන්ඩීසී
2021 පෙබරවාරි මස 20 දින සිට



68 වන සේනාංකයේ
සේනාංකාධිපති ලෙස
බ්‍රිගේඩියර්
කේආර්කේකේපී බණ්ඩාර
ආර්එස්පී යූඑස්පී
2021 පෙබරවාරි මස 20 දින සිට



144 වන පාබල බලසේනාවේ
බලසේනාධිපති ලෙස
බ්‍රිගේඩියර්
ඩබ්ලිව්එස්කේ ලියනවඩුගේ
ආර්එස්පී
2021 ජනවාරි මස 26 දින සිට



ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා
බලසේනාවේ සේනාධිනායක ලෙස
මේජර් ජෙනරාල්
සේවන්ත් කොටුවේගොඩ
එන්ඩීසී අයිපී
2021 පෙබරවාරි මස 28 දින සිට



56 වන පාබල සේනාංකයේ
සේනාංකාධිපති ලෙස
බ්‍රිගේඩියර්
ඊඒඩීඑන්එස්පී දූනුවිල
ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී
2021 ජනවාරි මස 21 දින සිට



ආරක්ෂක සේනා මූලස්ථානය
(බටහිර)
බ්‍රිගේඩියර් (පාලන/හකාස) ලෙස
බ්‍රිගේඩියර්
පීඩීආර්යූකේ ගල්හේනගේ
2021 පෙබරවාරි මස 24 දින සිට



511 වන පාබල බලසේනාවේ
බලසේනාධිපති ලෙස
කර්නල්
පීඑස්ජේඑස් ප්‍රනාන්දු යූඑස්පී
2021 ජනවාරි මස 14 දින සිට



ආරක්ෂක සේනා
මූලස්ථානය(මධ්‍යම)
ආඥාපති ලෙස
මේජර් ජෙනරාල්
එන්ආර් ලමාහේවගේ ආර්ඩබ්ලිව්පී
ආර්එස්පී එන්ඩියූ
2021 පෙබරවාරි මස 24 දින සිට



59 වන පාබල සේනාංකයේ
සේනාංකාධිපති ලෙස
බ්‍රිගේඩියර්
පීඩී සූරියබණ්ඩාර යූඑස්පී
2021 පෙබරවාරි මස 19 දින සිට



විශේෂ බලකා බලසේනා
මූලස්ථානයේ බලසේනාධිපති ලෙස
බ්‍රිගේඩියර්
එම්ටීඅයි මහලේකම්
ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී
ආර්එස්පී යූඑස්පී එන්ඩියූ පීඑස්සී
2021 ජනවාරි මස 29 දින සිට



551 වන පාබල බලසේනාවේ
බලසේනාධිපති ලෙස
කර්නල්
ඩීසීඑස් වික්‍රමසිංහ
යූඑස්පී යූඑස්ඒසීජීඑස්සී
2021 ජනවාරි මස 29 දින සිට



ආරක්ෂක සේනා මූලස්ථානය
(නැගෙනහිර) ආඥාපති ලෙස
මේජර් ජෙනරාල්
ඕඩී විරසූරිය
ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ
2021 ජනවාරි මස 25 දින සිට



24 වන පාබල සේනාංකයේ
සේනාංකාධිපති ලෙස
මේජර් ජෙනරාල්
ඊඩී ලමාහේවා ඩබ්ලිව්ඩබ්ලිව්වී
ආර්ඩබ්ලිව්පී ආර්එස්පී
2021 පෙබරවාරි මස 08 දින සිට



ආරක්ෂක සේනා මූලස්ථානය
(මුලතිව්) කර්නල් (ප්‍රමාණි) ලෙස
කර්නල්
ඩබ්ලිව්එස්වී ප්‍රනාන්දු යූඑස්පී
අයිපී
2021 පෙබරවාරි මස 22 දින සිට



14 වන පාබල සේනාංකයේ
සේනාංකාධිපති ලෙස
මේජර් ජෙනරාල්
ඩීජීඑස් සෙනරත්යාපා ආර්ඩබ්ලිව්පී
ආර්එස්පී එන්ඩියූ
2021 පෙබරවාරි මස 22 දින සිට



ආරක්ෂක සේනා
මූලස්ථානය(මධ්‍යම)
බ්‍රිගේඩියර් ප්‍රමාණි ලෙස
බ්‍රිගේඩියර්
කේඩබ්ලිව්එස් රත්නායක එන්ඩියූ
2021 පෙබරවාරි මස 18 දින සිට



23 වන සේනාංකයේ
සේනාංකාධිපති ලෙස
බ්‍රිගේඩියර්
කේඑච්එන් කොස්වත්ත
ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ
2020 දෙසැම්බර් මස 29 දින සිට

වෘත්තීය දිවියේ ගෞරවනීය කඩඉම් පසුකොට
සුබ මොහොතින් නව තනතුරු ලද
ඔබ සියලු දෙනාට දිරිය, විරිය, ඊශ්වර්යය ලැබේවායි "රණවිරුවා" ද
මෙසේ සුබ පතුම් එක්කරයි.



රෙජිමේන්තු මුලස්ථාන බලඇණිය
විශේෂ බලකායේ අණදෙන
නිලධාරී ලෙස
ලුතිනන් කර්නල්
එස්ඩීවීල් අනුරුද්ධ කුමාර
ආර්ඩබ්ලිව්පී ආර්එස්පී විඑ
2021 ජනවාරි මස 04 දින සිට



ආරක්‍ෂක සේනා
මුලස්ථානය(බටහිර)
ජ්‍යෙෂ්ඨ සිවිල් සම්බන්ධීකරණ
නිලධාරී ලෙස
ලුතිනන් කර්නල්
ඩබ්ලිව්පීකේඑච් පතිරණ
ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගරෙ
2021 පෙබරවාරි මස 16 දින සිට



රෙජිමේන්තු මුලස්ථාන බලඇණිය
(ගැමුණු) අණදෙන නිලධාරී ලෙස
ලුතිනන් කර්නල්
පීඩීඩීඇම්එස් සමරනායක
ආර්එස්පී ගැමුණු
2021 ජනවාරි මස 28 දින සිට



මාණ්ඩලික රාජකාරී අධ්‍යක්‍ෂ
මණ්ඩලයේ
ප්‍රමාණි I(සම්බන්ධීකරණ) ලෙස
ලුතිනන් කර්නල්
පීආර්ඒඅයිඑම්කේ ගමිලත්
ආර්එස්පී යූඑස්පී පීඑස්සී ශ්‍රීලකාහ
2021 පෙබරවාරි මස 23 දින සිට



3 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා
පොදුසේවා බලකායේ අණදෙන
නිලධාරී ලෙස
ලුතිනන් කර්නල්
ඒඑල්ඒඅයි පීරිස් ශ්‍රීලයුපොදුසේබ
2021 ජනවාරි මස 29 දින සිට



ආරක්‍ෂක සේනා
මුලස්ථානය(මධ්‍යම) සිවිල්
සම්බන්ධීකරණ නිලධාරී ලෙස
ලුතිනන් කර්නල්
ඩීආර්ඩීකේ කොහොඹන්
ශ්‍රීලංජාඅබමු
2021 ජනවාරි මස 26 දින සිට



ආරක්‍ෂක සේනා
මුලස්ථානය(මුලතිව්)
මාණ්‍ I (පාලන/භාණ්ඩ) ලෙස
ලුතිනන් කර්නල්
ඊආර්ඊ පත්මකුමාර ශ්‍රීලයුපොදුසේබ
2021 පෙබරවාරි මස 02 දින සිට



8 වන කාරක ඉංජිනේරු
රෙජිමේන්තුවේ
අණදෙන නිලධාරී ලෙස
මේජර්
ඊඑල්ඒඩබ්ලිව්කේ ඇතුගල
ආර්එස්පී යූඑස්පී ශ්‍රීලංඉ
2021 ජනවාරි මස 31 දින සිට



21 වන ශ්‍රී ලංකා
සිංහ රෙජිමේන්තුවේ
අණදෙන නිලධාරී ලෙස
මේජර්
එම්පීඑස්කේ නිල්මල්ගොඩ
ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලංසිරෙ
2021 ජනවාරි මස 29 දින සිට



11 වන බළඇණිය
විජයබාහු පාබල රෙජිමේන්තුවේ
අණදෙන නිලධාරී ලෙස
මේජර්
එන්ආර්එම්ටී නිශ්ශංක
ආර්එස්පී යූඑස්පී විපාරෙ
2021 ජනවාරි මස 03 දින සිට





# SOME LEADERS ARE BORN GREAT WHILST OTHERS ARE MADE GREAT; THEN WHAT ABOUT PLATOON LEADERS?

*Officer Cadets who pass out from military academies, local (SLMA) or foreign as 2/ Lts are subject to follow an almost 3 years long military training coupled with certain academic subjects which are highly essential for them to play the role of a responsible job as a platoon leader, a leader of 34 men. Just a school leaver who joins the army as an officer cadet is molded by the Army to be a prospective young leader through a sound and comprehensive training which encompasses both theoretical and practical modules. During the training, he is taught not only military and selected academic subjects, but leadership, personality development, social etiquettes, communicative language, presentation skills and many more to be a versatile personality.*

*After this comprehensive training, he receives his commission and takes up the command of a platoon where he finds platoon sergeant as his deputy, few corporals and soldiers who are experienced hard boiled veterans in his platoon. In this backdrop, it is obvious that this young leader with no experience and service will have to face immense challenges in leading them. However, if this young leader is tactful and possesses a solid foundation on basic military learning, he will convincingly be able to overcome those challenges and win the confidence of his team.*

*The first and foremost concern is, he should have a strong desire and ego to lead his platoon effectively. This egoism would drive him forward breaking all the impediments. However, this does not mean that you should behave as if you know everything neglecting the opinions and suggestions of your subordinate leaders and men. Your behavior, actions and attitudes must ensure that all members of your platoon should feel a sense of belonging having a voice without discrimination or neglect.*

*Another way of winning or losing the confidence of your men is your knowledge. Within a short period of time after taking over the command of your platoon, you must make all the efforts to enhance your military knowledge. You must be conversant about your job.Your instructor ability, knowledge on weapon handling, firing efficiency, map reading, drill, tactics, military procedures and formalities should be perfect. Your sound military knowledge mingled with bravery and ability of taking risks as a platoon leader would definitely enhance the confidence of your men on you.*

*Another point is your physical efficiency and mental robustness. Physically you must be fitter than your men. During the rigorous physical activity or sports, you must lead them from the front. Mentally you must be able to absorb pressure without getting panic. Also you must have a fair knowledge on every game that commonly plays within your unit line or Army. You must be able to guide your men and coach them when it is required. This will boost up the trust and confidence of your men on your command.*

*Another important point is, you must avail yourself for your men for any guidance or advices. You must lavishly share your time with them; spend some cool time with them off the duty. This is vital for you to know them better. Never have cronies or "My Men" in your platoon. When your men sense or feel that you are with them during their good and bad times, strong bond is developed between you and your men, which ultimately enable you to lead them at your discretion winning their honor.*

*During the war or peace, leading a group of men is challenging, but a blessing. Becoming an effective platoon leader is a stepping stone of the career of any successful military leader. To be responsible for the lives of 34 men is a daunting challenge for the young man with less experience. Nevertheless, if your approach is right blending with strong leadership qualities together with impeccable character and enthusiasm, you will overcome all sorts of challenges come across your way and will be regarded as an astute and fitting leader not only by your men but superiors too.*



**Brig Keerthi Kottawaththa RWP RSP USP**
**Dir'ctor HR & HL - AHQ**




# කම්ටු වාර්තාව...



**ආයතන ප්‍රධානියා** - "අර නාස්තිය දූෂණය පිළබඳ සොයාබලන්න පත්කරපු කමිටු වාර්ථාව ආව කිව්ව නේද? මොනවද ඒකේ තියෙන්නේ"

**ලේකම්වරයා** - "ඔව් ඔව් සර්.... හය මාසෙකට පස්සෙ කමිටු වාර්ථාව ආවා. ඒකෙත් තියනව ආයතනයේ ඉදිරි වැඩ නිරීක්ෂණයට නව කමිටුවක් පත්කරන්න ඕන කියල"

# කඩියන් සේ වැඩකරන්නෝ...

වෙනදා කඩියන් සේ වැඩකරන සේවක පිරිස අද බොහොම සෙමින් වැඩකරන අයුරු කාටත් හොරෙන් ආයතනයට රිංගාගත් ලොක්කාට දක්නට ලැබිණි.

"මොකද අද කිසි කලබලයක් නැත්තේ? ලොක්කා විමසා සිටියේය.

"අපි සර් එනව දැක්කේ නැහැ, ඒකයි සර්" සේවිකාව කියා සිටියා.



(යුද්දෙ කාලෙ කතාවක්)

## "ජුලියට් ගෙන් ගුටිකෑ රෝමියෝ"

එක්තරා නිලධාරියෙක් දවසක් ගුවන් විදුලි යන්ත්‍රයෙන් සෙබළෙකුට කතා කළා. කොයිතරම් කතා කළත් සෙට්එක "නෝ ආන්සර්". දැන් ඉතින් නිලධාරියාට යකා නැගල.

තවත් දෙපාරක් තුන්පාරක් කතා කරනකොට "ඕකේ" එක දුන්නා. ඊට පස්සෙ නිලධාරියා ඇහුව කවුද කතා කරන්නේ කියල. සෙබළගෙ නම රත්නායක.

"රොජර්" මම රෝමියෝ කතා කරන්නෙ ඕව" කිව්වා.

ඊට පසු නිලධාරියා පැවසුවා,

"කල්පනාවෙං හිටපං මං මේ ජුලියට් කතා කරන්නේ... සෙට් එකට ඇහුම්කන් දීගෙන හිටපං" කියා.

ඉන් පසුව රෑ 10 ට පමණ ජුලියට් ආවා පොයින්ට් චෙක් කරන්න. ඒ එනකොට රෝමියෝ සෙට්එක ඔළුවට තියාගෙන "කපල ගහල" . ජුලියට් හොරෙන්ම සෙට්එකත් අරගෙනම "ඔෆිසර් මෙස්" එකට ගියා.

රෝමියෝ ඇහැරෙනකොට සෙට්එක නැහැ. දැන් රෝමියෝ කලුවරේ වටේ දුවනව, සෙට්එක සොයන්න. රෝමියෝ කරුණු සොයා බලන කොට ජුලියට් සෙට්එක අරගෙන ගිය බව දැනගත්ත. රෝමියෝ ඇරියෙත් නැහැ. මහ රෑම ගියා ජුලියට් සොයාගෙන. හැබැයි ජුලියට් ඉන්නෙ උඩ තට්ටුවක.

"යන්න ඕනි ඉනිමගෙන්"

රෝමියෝ හොරෙන් හොරෙන් නැග්ග ඉනිමග දිගේ ජුලියට් ඉන්න කාමරේට. රෝමියෝ දැක්ක මැද ලාම්පු එළියට එයාගේ සෙට්එක ජුලියට් ළග තියාගෙන නිදාගෙන ඉන්නව. රෝමියෝ දැන් යනවා කකුලේ ඇගිලිවලින් ඉස්සි ඉස්සි. හිමීට ගත්ත සෙට්එක. ගන්නකොටම ජුලියට්ට මාට්ටු. ඊට පස්සෙ රෝමියෝගෙ මූණ ඉදිමෙන තුරු ගුටි පූජාවක් ලැබුණා.

ඔන්න ඕකයි අළුත්ම රෝමියෝ ජුලියට් ආදර අන්දරය...

**සෙ/00199 ලා/කෝ ප්‍රියන්ත රත්නායක**
**10 විජාරෙ - ජේදුරුතුඩුව**
**("රණවිරුවා" 2000 ඔක්තෝබර් කලාපයෙනි)**



# සුරංගනා කථා...

"ළමයා අර බිරිඳ හීලෑ කරගැනීම කියන පොත තියෙන්නෙ කොහෙද"

"ආ... සර් කෙළවරේ පොත් රාක්කෙ තමයි සුරංගනා කථා තියෙන්නේ"




***English Vision*** පාඩම් මාලාව ඔස්සේ ***Art of the language*** (භාෂාවේ කලාව) අධ්‍යයනය සඳහා "රණවිරුවා" මාසික සඟරාව මඟින් ඔබ හමුවට ගෙන එන තවත් එක් සරල ඉංග්‍රීසි වාක්‍ය රටාවක භාවිතය පිළිබඳව මෙම කලාපය තුළින් අවධානය යොමු කරමු.

## Interested in

යම් කිසි කාර්යක් කිරීමට "සතුටුයි, කැමතියි" යන අර්ථය හඟවමින් තමන් කුමන හෝ දෙයකට, යමකට ඇති කැමැත්ත ප්‍රකාශ කිරීම සඳහා මෙම වාක්‍යය රටාව භාවිතා කළ හැක.

**Subject + am/ is / are + Interested in+ Verb (ing) + Object + Rest.**
සබ්ජෙකට් + ඇම්/ඊස්/ආ + ඉන්ටරෙස්ටඩ් ඉන් + වර්බ්(අයිඑන්ජී) + ඔබ්ජෙක්ට් + රෙස්ට්.
කර්තෘ + උපකාරක ක්‍රියා පද + සතුටුයි, කැමතියි + ක්‍රියාපදය(**ing** ස්වරූපය) + කර්මය + ඉතිරිය.

***Ex*** / උදා :-

1. He is interested in watching new Tamil films.
   හී ඊස් ඉන්ටරෙස්ටඩ් ඉන් වොචින් නිව් ටැමිල් ෆිල්ම්ස්.
   ඔහු අලුත් දෙමළ චිත්‍රපට බලන්න කැමතියි.
2. Young boys are interested in playing cricket.
   යන්ග් බෝයිස් ආ ඉන්ටරෙස්ටඩ් ඉන් ප්ලේයින් ක්‍රිකට්.
   තරුණ පිරිමි ළමයි ක්‍රිකට් සෙල්ලම් කරන්න කැමතියි.
3. University students are interested in reading English novels.
   යුනිවසිටි ස්ටියුඩන්ට්ස් ආ ඉන්ටරෙස්ටඩ් ඉන් රීඩින් ඉංග්ලිස් නවල්ස්.
   සරසවි සිසුන් ඉංග්‍රීසි නවකතා කියවන්න කැමතියි.

***Nota Bene*** / සැ.යු :-

ඉහත වාක්‍යයන්හි අර්ථය හා භාවිතයන් පිළිබඳ සැලකීමේදී,

- **Subject :-** කර්තෘ පදය ඒකවචන හා බහුවචන රූප උපකාරක ක්‍රියා පද සමග භාවිතා වේ.

  **Am** – වෙමි, සිටිමි යන අර්ත ඇතිව I - මම යන කර්තෘ පදය සමග පමණක් භාවිතා වේ.
  **Is** – වෙයි, සිටියි, ඉඳියි යන අර්ත ඇතිව ඒක වචන පදය (Singular - He ඔහු, She ඇය, It එය) යන කර්තෘ පද සමග පමණක් භාවිතා වේ.

  **Are** - වෙනවා, සිටිනවා, ඉන්නවා යන අර්ථ ඇතිව බහු වචන (Plural - I මල We අපි, You ඔබ, ඔබලා, They ඔවුන්) යන කර්තෘ පදය සමග පමණක් භාවිතා වේ.

- **Interested in :-** "ඉතා කැමතියි, ඉතා ආසයි" ආදි වශයෙන් අර්ථය ගැනීම සඳහා මෙම කණ්ඩය කිසිදු වෙනසකින් තොරව වාක්‍යයේ භාවිතා වේ.

- **Verb :-** ක්‍රියා පදය වාක්‍යයේ භාවිතා කිරීමේදී (ing) ක්‍රියා රූපයක් ලෙස භාවිතා කළ යුතුය.

- **Object :-** කර්ම පදය වශයෙන් කර්තෘ කරන ක්‍රියාවට භාජනය වන බලපෑම් ලබන පුද්ගලයෙකු හෝ පදයක් වේනම් එය කර්ම පදය ලෙස වාක්‍යයෙහි ඒකවචන, බහුවචන භේදයකින් තොරව භාවිතා වේ.

- **Rest :-** ඉතිරිය වාක්‍යයෙහි කර්තෘ, ක්‍රියාව, කර්මය ආදි වශයෙන් පිළිවෙලින් යෙදී කාලය හඟවන පද වේ නම් ඒවා ඉතිරිය ලෙස වාක්‍යයෙහි අග භාවිතා වේ.

**Analysis of the sentence formation**
**වාක්‍යය රටාවෙහි සැකැස්ම විශ්ලේෂනය.**

Subject + am/ is / are + Interested in+ Verb (ing) + Object + Rest.
සබ්ජෙක්ට් + ඇම්/ඊස්/ආ + ඉන්ටරෙස්ටඩ් ඉන් + වර්බ් (අයිඑන්ජී) ඔබ්ජෙක්ට් + රෙස්ට්.
කර්තෘ + උපකාරක ක්‍රියා පද + සතුටුයි, කැමතියි + ක්‍රියාපදය (ing ස්වරූපය) + කර්මය + ඉතිරිය.

He is interested in watching new Tamil films.
හී ඊස් ඉන්ටරෙස්ටඩ් ඉන් වොචින් නිව් ටැමිල් ෆිල්ම්ස්.
ඔහු අලුත් දෙමළ චිත්‍රපට බලන්න කැමතියි.

ප්‍රායෝගික අභ්‍යාස සඳහා වාක්‍ය නිර්මාණය කර වාක්‍ය රටාවෙහි භාවිතය මැනවින් අවබෝධකර ගනිමු.

***" English vision"*** නව පාඩම් මාලාවක් ඔස්සේ ඔබගේ ඉංග්‍රීසි භාෂා දැනුම වර්ධනය සඳහා "රණවිරුවා" මීළඟ කලාපය සමග එක්වන්න. තවද ඔබට මඟ හැරුණු පාඩම් අධ්‍යයනය කිරීම සඳහා පහත දී ඇති වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.

කපිතාන් චමින්ද ලියනගේ
ශිල්පොදේශක
සංඥා පුහුණු පාසල - බුවැලිකඩ
www.englishvision.lk







# නිදහස් දිනය වෙනුවෙන් වැඩසටහන් රැසක්...

73 වන ජාතික නිදහස් දිනයට සමගාමීව ඉකුත් පෙබරවාරි 04 වන දින විජයබාහු පාබල රෙජිමේන්තුවේ නියෝජ්‍ය සේනාවිධායක කර්නල් කේඒඩීසීආර් කන්නන්ගර ආර්එස්පී ගේ ප්‍රධානත්වයෙන් වැඩසටහන් මාලාවක් පැවැත්විණ. එහිදී එදින නිල උසස් වූ නිලධාරීන් සහ සෙසුනිලයින් රැසක් වෙත නිල ලාංඡන පැළඳවීම විශේෂ විය.


## රණවිරුවා

පරිගණක අකුරු සංයෝජනය,
කවර නිර්මාණය හා පිටු සැකසුම
සෙ/752158 බිහි II සේනාරත්න ජීසී
3 ඉසේරෙ
සෙ/753797 කෝප්‍රල් කුමාරසිංහ
එම්ජීජීඑම් 11 ඉසේරෙ
සෙ/754676 ලාන්ස් කෝප්‍රල්
ලක්තිලිණ ඩබ්ලිව්ආර් 11 ඉසේරෙ



රණවිරුවා ලිපිනය

රණවිරුවා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය,
යුද්ධ හමුදා මූලස්ථානය,
ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ.

ඊමේල්

dtepsyops@army.lk
ranaviruwa@yahoo.com

දුරකථන

011 2993076

යුධ දිගුව

51445/51446



ප්‍රකාශනය

ශ්‍රී ලංකා යුද්ධ හමුදා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම්
අධ්‍යක්ෂ මණ්ඩලය








අධීක්ෂණය

බ්‍රිගේඩියර් ඊඑස්බීඩබ්ලිව් සෙනෙවිරත්න
යූඑස්පී පීඑස්සී



උපදේශකත්වය

ලුතිනන් කර්නල් වීඑම්එම් දිසානායක
ආර්ඩබ්ලිව්පී යූඑස්පී



ප්‍රධාන සංස්කාරක

මේජර් සුජිත් චමින්ද එදිරිසිංහ
ශ්‍රීලංපාබස



සහාය සංස්කාරක

කපිතාන් ආර්ජී ගෙවාවිතාරණ ශ්‍රීලයුකාබ

# දිස්ත්‍රික් රණවිරු සම්බන්ධීකාරක නිලධාරීන් අමතයි...

රණවිරු සේවා අධ්‍යක්‍ෂකගේ ඉල්ලීමකට අනුව, දිවයින පුරා පරිපාලන දිස්ත්‍රික් 22 ක ස්ථාපිත "රණවිරු" සංගම් සම්බන්ධීකාරක නිලධාරීන් ඇතුළු එම ප්‍රදේශයන්හි සිවිල් සම්බන්ධීකරණ නිලධාරීන් සහ ආරක්ෂක සේනා මූලස්ථාන නියෝජනය කරමින් නිලධාරීන් 100 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් ඉකුත් පෙබරවාරි 18 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී මෙන්ම යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී හමුවූහ.



එහිදී අදහස් දැක්වූ යුද්ධ හමුදාධිපතිතුමන්, විශ්‍රාමික හමුදා සාමාජිකයින් මෙන්ම තුවාල ලැබූ හා රට වෙනුවෙන් දිවිපිදූ රණවිරුවන්ගේ පවුලේ සාමාජිකයින් රැකබලා ගැනීම සහ සුබසාධන කටයුතු සිදුකිරීම යුද්ධ හමුදාවේ පරම යුතුකමක් වන බවත් ඒ වෙනුවෙන් පිහිටා ඇති රණවිරු සේවා අධිකාරිය සහ යුද්ධ හමුදා රණවිරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය මගින් එම කටයුතු අඛණ්ඩව සිදුකරනු ලබන බවත් පැවසීය.







# මරණ බියක් නැති විරුවන්...

මඩොල්සිම පුංචි ලෝකාන්තය නැරඹීමට ගොස් අතුරුදහන් වූ 35 හැවිරිදි අයෙකු සොයා යුද්ධ හමුදා විශේෂ බලකා සෙබළු පිරිසක් පසුගියදා අභියෝගාත්මක මෙහෙයුමකට එක්වූහ. හාත්පස නොපෙනෙන මීදුමද, අධික ශීතලද නොතකමින් එකී වීරෝධාර සෙබළු පුංචි ලෝකාන්තයේ ප්‍රපාතයෙන් පහළට බසින ලද්දේ බිය නොහඳුනන එඩිතර පුතුන්ගේ රණකාමී මතක සිහිගන්වමිනි. මෙවර රණවිරුවා පසුකවරය වෙන් කෙරෙනුයේ ඔවුනට උපහාර පිණිසය.



සරණ පිණිස අප වට කඳවුරු බැන්ද
පරණ වීද මෙහෙවර අමතක මන්ද
දරණ ගැසෙන රුපු බළමුළු සිඳ බින්ද
මරණ බියක් නැති විරුවන් කොතරම්ද

මේජර් සුජිත් චමින්ද එදිරිසිංහ